# 2022.03.08 මහා සභා රැස්වීම් වාර්තාව

## රැස්වීම සඳහා සහභාගී වූ ගරු මන්ත්‍රීවරුන්

01.ප්‍රාදේශීය සභා ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා
02.ප්‍රාදේශීය සභා ගරු උප සභාපති රංජිත් ආනන්ද බණ්ඩාර මහතා
03.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.කේ.නිමල් ප්‍රේමසිරි දයානන්ද මහතා
04.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ආර්.පී.සරත්චන්ද්‍ර ජයතිලක මහතා
05. ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එල් .ඒ.විරාජ් මධුසංක විජේසිංහ මහතා
06.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රීනී ඩී. නිමාලි දිල්හානි මෙනවිය
07.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩී.එම්.සුනිල් හේමචන්ද්‍ර දිසානායක මහතා
08.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ආර්.ඩබ්ලිව්.බී.එම්.ඉන්දික ප්‍රදීප් රාජගුරු මහතා
09.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ඒ.චමින්ද ප්‍රදී මල්ලවආරච්චි මහතා
10.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එච්.එම්.ජයන්ත හේරත් මහතා
11.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.එම්.නන්දසිරි මහතා
12.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එච්.එම්.ප්‍රදීප් සුජීව හේරත් මහතා
13.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී අමිල නිශාන්ත අරවින්ද මහතා
14. ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ජේ.පී.අමරසිංහ මහතා
15.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එන්.ජී.සුනිල් බණ්ඩාර හපුගම්මන මහතා
16.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ටී.එම්.ප්‍රදී සමන් කුමාරසිරි තෙන්නකෝන් මහතා
17.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රීනී අයි. සද්නා දිල්හානි ප්‍රනාන්දු මහත්මිය
18.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩබ්ලිව්.ඒ.දනුක සුභාෂන් වනසිංහ මහතා
19.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩී.ජී.බී.එම්.චාමින්ද දසනායක මහතා
20.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රීනී අයි.ඒ.බංඩාරමැණිකා මහත්මිය
21.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඒ.එන්.පද්මා වීරසිංහ මහත්මිය
22.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රීනි එල්.එම්.ගුණරත්මැණිකා මහත්මිය
23.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ඩී.මනෝ කුමාර එදිරිසිංහ මහතා
24.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රීනි එම්.නිශාන්ති ගුණතිලක මහත්මිය
25.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී බී.එම්.ගීතා කුමාරි බාලසූරිය මහත්මිය
26.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ජී.විරාජ් මලින්ද ඩයස් මහතා
27.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ටී.ආර්.එම්.අපර්ණ නිලුපුල් සේනාරත්න මහතා
28.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ජේ.පී.නිශාන්ත දේශප්‍රිය ජයලත් මහතා
29. ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී වයි.ජී.සංජීව කරුණාසාගර මහතා
30.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එස්.එම්. පයිසර් මහතා
31.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී පී.එම්.කුමාරසේන ජයලත් මහතා
32.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඒ.ජී.ඩී.රංජිත් ප්‍රේමලාල් මහතා
33.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩී.එම්.අජිත් චන්ද්‍රරත්න මහතා

**රැස්වීම සඳහා සහභාගි නොවූ ගරු මන්ත්‍රීවරුන්**

01.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ටී.එම්. ජාබීර් මහතා
02.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඒ.පී.තරංග චම්පික අලහකෝන් මහතා
03.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එච්.එම්.කමල්සිරි මහතා

04.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එච්.එම්.උදේශිකා මාධවී හේරත් මහත්මිය
05.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඒ.පී.සචින්තා අමාලි මෙනවිය

**ආගම සිහි කිරීම.**

ප්‍රථමයෙන් ජාතික ගීය වාදනය, ආගම සිහිකිරීමෙන් අනතුරුව මිය ගිය රණවිරුවන් සිහිකර ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතාගේ ප්‍රධානත්වයෙන් පෙ.ව.10.00 ට පමණ ගරු සභාවේ කටයුතු න්‍යාය පත්‍රානුකූලව ආරම්භ කරන ලදී.2022 මාර්තු මස මහා සභා රැස්වීමට සහභාගි වන ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී මණ්ඩලය ,ලේකම් ඇතුළු කාර්ය මණ්ඩල නිලධාරීන් , මාධ්‍යවේදීන් ඇතුළු සහභාගි වී සිටින සියලු දෙනාට ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා සුභ උදෑසනක් ප්‍රාර්ථනා කරන ලද අතර සියලු දෙනාම ගෞරවයෙන් පිළිගන්නා ලදී.

## 01.පසුගිය රැස්වීමේ වාර්තාව සම්මත කිරීම.

## I.2022.02.08 වන දින පැවති මහා සභා රැස්වීමේ රැස්වීම් වාර්තාව සම්මත කිරීම.

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

2022.02.08 වන දින පැවති මහා සභා රැස්වීමේ රැස්වීම් වාර්තාවේ අඩුපාඩු ඇත්නම් එය පෙන්වා දෙන ලෙසත් , එසේ නොමැති නම් පසුගිය සභා වාර්තාව සත්‍ය වාර්තාවක් බවට සභා සම්මත කරන ලෙසත් දන්වා සිටිනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනි එල්.එම්.ගුණරත්මැණිකා මහත්මිය - (එ.ජා.ප.)</u>**

2022.02.08 වන දින පැවති මහ සභා රැස්වීම් වාර්තාව සංශෝධනයන්ට යටත්ව පිළිගැනීම සුදුසු බව මා යෝජනා කරනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ජේ.පී.නිශාන්ත දේශප්‍රිය ජයලත් මහතා - (එ.ජ.නි.ස.)</u>**

2022.02.08 වන දින පැවති මහ සභා රැස්වීම් වාර්තාව සංශෝධනයන්ට යටත්ව පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මා ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

ඒ අනුව 2022.02.08 වන දින පැවති මහා සභා රැස්වීමේ රැස්වීම් වාර්තාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව 2022.02.08 වන දින පැවති මහා සභා රැස්වීමේ රැස්වීම් වාර්තාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත විය.**

## 02.සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන.

ගරු සභාපතිතුමා විසින් 2022.02.08 දින මහා සභාවේ ප්‍රගතිය ඉදිරිපත් කරන ලදී.

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

බණ්ඩාරකොස්වත්ත ජල ගැටළුවට විසඳුමක් ලෙස අපි ළිඳක් ඉදි කලා.ඒ ළිඳ ඉදි කිරීමේ කටයුතු අවසාන වෙමින් පවතිනවා.අපිට හෙට්ටිපොල ඉඳන් බණ්ඩාරකොස්වත්තට ජලය සැපයීමට විශාල වියදමක් දැරීමට සිදු වී තිබෙනවා.පසුගිය කාලයේ මාස දෙක හමාරකට අධික කාලයක් විශාල ජලය ප්‍රමාණයක් හෙට්ටිපොල ඉඳන් බණ්ඩාරකොස්වත්තට ප්‍රවාහනය කිරීමට සිදු වුණා.වසරකට කෝටි එක හමාරකට ආසන්න ප්‍රමාණයක් මේ සඳහා වැය වෙනවා.ඒ නිසා අපි මේ ළිඳ ඉදිකිරීමේ කටයුතු සිදු කළා.අපි මේ සඳහා වැය කළේ ලක්ෂ විසි පහයි.ඒ නිසා ඒ ළිඳ ඉදිකිරීමෙන් විශාල මුදලක් අපිට ඉතිරි කර ගන්න පුළුවන්.බණ්ඩාරකොස්වත්ත ජල ප්‍රශ්නයට සාර්ථක විසඳුමක් ලෙස මේ ළිඳ ප්‍රයෝජනයට ගන්න පුළුවන්.තව දින කිහිපයකින් ළිඳ ඉදි කිරීමේ කටයුතු අවසන් කරනවා.අවසන් කල වහාම ජල පොම්පාගාරයට ජලය යවන වැඩපිළිවෙල අපි ක්‍රියාත්මක කරනවා.බණ්ඩාරකොස්වත්ත ජනතාවට මේ ළිඳත්,නල ළිඳත් යොදාගෙන ජලය ලබා ගන්න පුළුවන්.මේ අවස්ථාවේ මම විශේෂ ස්තූතියක් ප්‍රකාශ කරනවා.පොල ආසන්නයේ තිබෙන ඉඩම අයිතිය තිබෙන්නේ උපුල් මහතාටයි.ඒ ඉඩම හරහා තමයි අපි මේ නලය ඉදි කිරීම් කරන්නේ.එතුමා අපිට අවස්ථාව ලබා දුන් නිසා විශාල මුදල් ප්‍රමාණයක් සභාවට ඉතිරි කර ගන්න පුළුවන් උනා.අපි එතුමාටත් එතුමාගේ පවුලේ සියලුම දෙනාටත් ස්තූතිය හා ප්‍රණාමය පුද කරනවා.ඒ වගේම දූනුපොත ප්‍රජා ජල ව්‍යාපෘතියේ ජල සබඳතාවය පිළිබඳව ගැටළුවක් තිබුණා.අපිත්,නිලධාරීනුත් ඒ සම්බන්ධව සොයා බැලීමට ගියා.එතනට ගියාම ඒ කියපු දේ නෙවෙයි තිබෙන්නේ.ඒ ජල ව්‍යාපෘතිය ආරම්භ කරන වෙලාවේ විශාල උනන්දුවක් තිබිලා තිබෙනවා

ජනතාවගේ.හැබැයි පසු කාලීනව ඒ ජනතාව තමන්ට අවශ්‍ය ජලය සපයා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරලා තිබෙනවා.සමහර ස්ථානවල නල ළිං ඉදි කරලා තිබෙනවා.මේ වගේ කාරණා නිසා අද ජල සමිතිය අක්‍රීය වී තිබෙනවා.මේ සම්බන්ධව කිසිම උනන්දුවක් ඒ සමිතියේ අය දක්වලා නැ.ඒ සමිතියේ හෝ සමිතියේ සාමාජිකයින්ගේ දුර්වලකම් නිසා ඒ ජල ව්‍යාපෘතිය අඩාල වෙලා තිබෙනවා.ඒ වගේම ඒ ජල සමිතියේ විදුලි බිල රුපියල් හතළිස් තුන් දහස් ගණනක්.බිල්පත් අය කරගෙන නැද්ද,මොනවා වෙලාදවත් අපිට හොයන්න බැ. දුනුපොත ජල සමිතියේ වර්තමාන තත්ත්වය ඒකයි.ඒ අයගේ සමිතිවල විශාල රැස්වීමක් පැවැත්වීමට නියමිතව තිබෙනවා.එහි දී මේ ගැන කතා කරන්න.මේ සමිතිය කරගෙන යනවාද නැද්ද කියන එක සම්බන්ධව අපි දැනුවත් වෙන්න ඕන.එහි සාමාජිකයින්ගේ අදහස් විමසලා ඒ ජල ව්‍යාපෘතිය අවශ්‍ය නැතිනම්,විදුලි බල මණ්ඩලයෙන් තවත් බිල් එනවා.අඩුම තරමින් මේ විදුලිය විසන්ධි කරන්න කියලාවත් කියලා නැ.ඒ නිසා මේ සම්බන්ධව ජල පාරිභෝගිකයින් දැනුවත් කරන ලෙස උපදෙස් දීලා අපි ආවේ.

ගරු මන්ත්‍රීවරුණි,ඔබතුමන්ලාට මාධ්‍යයෙන් දැන ගන්න ලැබෙන්න ඇති ඊයේ පළාත් පාලන ආයතන ප්‍රධානීන්ට දැනුම් දීමක් කළා විදුලි ප්‍රශ්නයට තාවකාලික විසඳුමක් ලෙස වීථි පහන් රාත්‍රී කාලයේ දී නිවා දමන්න කියලා.ඒ අනුව කටයුතු කරන ලෙස සියලුම ගරු මන්ත්‍රීවරු දැනුවත් කරනවා.

ඒ වගේම මෝටර් ග්‍රේඩරය අලුත්වැඩියා කිරීමේ කටයුතු සම්බන්ධව අපි පසුගිය සභාවල දීර්ඝව කතා කලා. මෝටර් ග්‍රේඩරය අලුත්වැඩියා කිරීමේ කටයුතු නියමිත දිනට පෙර අපිට ලබා දෙන බව අලුත්වැඩියා කිරීමේ කටයුතු සිදු කරන ආයතනය පැවසුවා.හැබැයි ඉදිරිපත් කල පිරිවිතර වලට අනුකූලව තමයි මෝටර් ග්‍රේඩරය අලුත්වැඩියා කරලා තිබෙන්නේ.නමුත් අලුත්වැඩියා කටයුතු කරගෙන යනකොට තවත් අමතර අලුත්වැඩියා තටයුතු කිහිපයක් හඳුනාගෙන තිබෙනවා.මමත්,අපේ අදාල නිළධාරීනුත්,යාන්ත්‍රික ඉංජිනේරු මහතාත් ගිහින් බැලුවා.ඇත්තටම ම කණගාටු වෙනවා,මෝටර් ග්‍රේඩරයේ සමහර කොටස් වලට ග්‍රීස් යොදලා නැ.මෙම වාහන හා යන්ත්‍ර නඩත්තුව පිළිබඳව වැඩමුළුවක් පවත්වලා අපේ රියදුරු මහත්වරු දැනුවත් කරන්න සිදු වෙනවා.අමතරව තිබෙන අලුත්වැඩියා කටයුතු සඳහා අදාල ආයතනයෙන් අපිට ඇස්තමේන්තුව ලබා දෙයි.බලාපොරොත්තු වූ මුදලට වඩා යම් මුදලක් වැඩි වෙයි.පසුගිය මාසවල මෝටර් ග්‍රේඩරය අලුත්වැඩියා කටයුතු සඳහා විශාල මුදලක් ගෙවලා තිබෙනවා.වරින් වර හදනවා,නැවත කැඩෙනවා.මේක සම්පූර්ණම අලුත්වැඩියා කරලා ගත්තොත් අපිට අඛණ්ඩව වැඩ කටයුතු සිදු කරන්න පුළුවන්.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.කේ.නිමල් ප්‍රේමසිරි දයානන්ද මහතා - (එ.ජා.ප.)**

ගරු සභාපතිතුමා,ඔබතුමා කීවානේ මේ මෝටර් ග්‍රේඩරය අලුත්වැඩියාවට අතිරේක ඇස්තමේන්තුවක් යනවා කියලා.ඒ අතර ග්‍රීස් ගහන කතාවකුත් කීවානේ.ඒක කියන්නේ ඉංජිනේරු මහතාද,ගරාජ් එකෙන්ද?

**ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා**

ගරාජ් එකෙන්.ගරු මන්ත්‍රීතුමා,අපිත් ගිහින් බැලුවා.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.කේ.නිමල් ප්‍රේමසිරි දයානන්ද මහතා - (එ.ජා.ප.)**

ගරු සභාපතිතුමනි,මෝටර් ග්‍රේඩර්,බැකෝ වාගේ යන්ත්‍ර වලට දවස ගණනේ ග්‍රීස් ගහන්න ඕන.මෙම වාහන හා යන්ත්‍ර නඩත්තුව පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට රියදුරු මහත්වරුන් වෙනුවෙන් වැඩමුළුවක් පැවැත්වීමට කටයුතු කිරීම සුදුසුයි.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ආර්.පී.සරත්චන්ද්‍ර ජයතිලක මහතා - (ශ්‍රී.ල.පො.ජ.පෙ.)**

ගරු සභාපතිතුමණි,මෝටර් ග්‍රේඩරයේ හිටපු රියදුරු චන්දිම මහතා වැඩකට ගියාම මෝටර් ග්‍රේඩරයට ග්‍රීස් යොදලා පිහලා සියල්ල කරලා තමයි බත් එක ගන්නේ.අපේ දිස්ත්‍රික්කයේ තිබෙන අනෙකුත් මෝටර් ග්‍රේඩර් එක්ක ගත්තාම අපේ මෝටර් ග්‍රේඩරය අද වන තුරුත් මේ තත්ත්වයේ තිබෙන්නේ එතුමා පාවිච්චි කල පිළිවෙල නිසයි.ඒක අපි දැකලා තිබෙනවා.ඒ වගේම ගරු සභාපතිතුමණි,ඔය විදියට සිදු වෙනවා නම් ග්‍රීස් මිල දී ගෙන මේවාට යොදන්නේත් නැතිනම් ග්‍රීස් වලට සිදු වන්නේ කුමක්ද කියලා සොයා බලන්න.චන්දිම මහතා එහෙම කලේ නෑ කියලා මගේ අත්දැකීමෙන් සඳහන් කරන්න පුළුවන්.

**ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා**

ඕනෑම වාහනයක්,යන්ත්‍රයක් ගෙවෙනවා.යකඩ ගෙවෙනවා.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩී.ජී.බී.එම්.චාමින්ද දසනායක මහතා - (එ.ජා.ප.)**

ගරු සභාපතිතුමණි,මේ අලුත්වැඩියා කටයුතු යාන්ත්‍රික ඉංජිනේරු මහත්මයෙකුගේ අධීක්ෂණය යටතේ නෙවෙයිද සිදු වෙන්නේ.

**ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා**

ගරු මන්ත්‍රීතුමා,මේ අලුත්වැඩියා කටයුතු කරන්න කලින් යාන්ත්‍රික ඉංජිනේරු මහත්මයෙක් එනවා.එතුමාගේ අධීක්ෂණය යටතේ තමයි මේ දේවල් කරන්න කියලා අපිට දෙන්නේ.ඒ පිරිවිතර අනුව තමයි අපි මිල ගණන් කැඳවලා ඒ අලුත්වැඩියා කටයුතු සිදු කරන්නේ.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩී.ජී.බී.එම්.චාමින්ද දසනායක මහතා - (එ.ජා.ප.)</u>**

ගරු සභාපතිතුමණි,ඕක හදලා ගේනවානේ.ගෙනත් ඕක රියදුරු මහතකුට භාර දෙනවානේ.එතුමාට මේක දෙද්දී ආයතනයේ නිළධාරී මහතකු අධීක්ෂණයට යොමු කලා නම් අදාල කටයුතු මඟ හැරිලා තිබෙනවා නම් ඒ සම්බන්ධව රියදුරු මහතා දැනුවත් කරන්න තිබුණා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩී.එම්.සුනිල් හේමචන්ද්‍ර දිසානායක මහතා - (එ.ජා.ප.)</u>**

ගරු සභාපතිතුමණි,ඔය ග්‍රීස් සමූපකාරයෙන්ද ලබා ගන්නේ.මගේ පාරක වැඩ කරන්න ගිහින් දවල් කෑමට පෙර ග්‍රීස් යොදන්න අලුත් ග්‍රීස් ටින් එකක් කැඩුවා.ඒ අලුත්ම ග්‍රීස් ටින් එකේ තිබිය යුතු ප්‍රමාණයෙන් කාලක්වත් ග්‍රීස් තිබුණේ නෑ.මගේ ඇස් දෙකෙන් මම දැක්කා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී වයි.ජී.සංජීව කරුණාසාගර මහතා - (ජ.වි.පෙ.)</u>**

ගරු සභාපතිතුමණි,මෝටර් ග්‍රේඩරය පමණක් නොවෙයි,මේ සභාවේ තිබෙන වාහන යන්ත්‍රෝපකරණ අලුත්වැඩියා කරන්න වසරකට විශාල මුදලක් වැය වෙනවා.සභාව සතුව වාහන විශාල ප්‍රමාණයක් තිබෙනවා.සභාවේ අයවැය ලේඛනය ගත්තත් එහි වැඩිපුර මුදල් වෙන් කර තිබෙන්නේ වාහන යන්ත්‍රෝපකරණ නඩත්තුවට.ඉන්ධන හා ස්නේහක තෙල් වලට.පසුගිය කාලයේ කලේ නෑ කියන තැනට යන්නේ නැතිව කටයුතු කල යුතුයි.යන්ත්‍ර සූත්‍ර අලුත්වැඩියාවට විශාල මුදලක් වැය කරනවා. මේ මුදල් ඉතිරි කර ගන්නා ආකාරයට කටයුතු කරන්න රියදුරු මහතුන්ට වගේම අපිටත් වගකීමක් තිබෙනවා.මේ නඩත්තු කටයුතු දෛනිකව පවත්වාගෙන යන ආකාරයට නඩත්තු ඒකකයක් ප්‍රාදේශීය සභාවෙන් ස්ථාපිත කල යුතුයි.ඒකට අවශ්‍ය කරන යාන්ත්‍රික ඉංජිනේරුවරයෙකුගේ උපදෙස් සහිතව අපේ සභාවේ කාර්මික නිලධාරී මහතුන්ගේ සහයෝගය ඇතිව අපි ස්ථාපිත කර ගත්තොත් අපිට නඩත්තු ඒකකයක් මේ ගැටළු ගොඩක් අඩු කර ගන්න පුළුවන් වෙයි.ඒ වගේම මුදල් ප්‍රමාණයකුත් ඉතිරි කර ගන්න පුළුවන්.පසුගිය සභා වාරයට මම සම්බන්ධ වුණේ නෑ.නමුත් මම දැක්කා සභා වාර්තාවේ තිබුණා මෝටර් ග්‍රේඩරය අලුත්වැඩියාවට පිරිවිතර කැඳවීම සම්බන්ධයෙන් ගැටළු සාකච්ඡා කරලා තිබුණා.ඒ සම්බන්ධයෙන් තිබෙන චෝදනා තමයි කතා කරලා තිබුණේ.ඒ නිසා සිදු වෙන්නේ මේක නම් වඩාත් හොඳයි නඩත්තු ඒකකයක් ප්‍රාදේශීය සභාවෙන් ස්ථාපිත කරලා අදාල කාර්මික නිලධාරී මහත්වරුන් බඳවාගෙන හෝ මේක ඉදිරියට පවත්වාගෙන යමු.ඒක තමයි මගේ යෝජනාව.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ටී.ආර්.එම්.අපර්ණ නිලුපුල් සේනාරත්න මහතා - (එ.ජ.නි.ස.)</u>**

ගරු මන්ත්‍රී වයි.ජී.සංජීව කරුණාසාගර මහතා ඉදිරිපත් කල කාරණය සමඟ එකඟතාවක් අපෙත් තිබෙනවා.පසුගිය කාල වකවානුව පුරාම මම දැක්කා මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය හෝ මොකක් හෝ යන්ත්‍රයක් කැඩෙනවා.ඒවා හදන්න අය ක්‍රමවේදයත් එක්ක මුදල් කමිටුවට යොමු කරනවා.ඒ වගේ කරුණු කාරණා නිසා මේකට ගත වන කාල සීමාව වැඩියි.ඒ නිසයි මේකේ වැඩ කරන්න තිබෙන කාලයට වඩා සභාව තුල හෝ වෙනත් තැනක රැදෙන කාල සීමාව වැඩි වෙලා තිබෙනවා.හැබැයි මේ කාල සීමාව තුල මේ ක්‍රමවේදය ගැටළු සහගත වෙලාත් තිබෙනවා.සභාව තුල තිබෙන මෝටර් ග්‍රේඩරය අඛණ්ඩව දැන් මාස ගණනාවක් කැඩිලා තිබෙනවා.පළාත් පාලන කොමසාරිස්තුමාගේ අනුමැතියත් අරන් සභාවේ නඩත්තු ඒකකයක් වැඩ ඒකකයක් සහිතව පවත්වාගෙන යන්න පුළුවන් නම් ඒක වඩාත් හොඳයි.මේවා ගැන අවධානයක් යොමු කරන්න කෙනෙක් යෙදවූවොත් ඒ සම්බන්ධ වගකීම ඒ අයට පැවරෙනවා.

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

ගරු මන්ත්‍රී වයි.ජී.සංජීව කරුණාසාගර මහතා,ගරු මන්ත්‍රී ටී.ආර්.එම්.අපර්ණ නිලුපුල් සේනාරත්න මහතා ඇතුළු ගරු මන්ත්‍රීවරු කිහිප දෙනෙක් මෝටර් ග්‍රේඩරය සම්බන්ධව අදහස් දැක්වූවා.මේ කාරණය මම ඉදිරිපත් කලේ මේ සම්බන්ධව ඔබතුමන්ලාගේ අවධානය යොමු කරවන්න.අපිට නඩත්තු ඒකකයක් හදන්න පුළුවන්.නමුත් අපිට ඒ සඳහා අදාල අනුමැතිය නෑ.මේවා නඩත්තු කිරීම සම්බන්ධව රියදුරු මහත්වරු වගකීම භාර ගන්න ඕන.ඒ වගේම කාර්මික නිලධාරී මහත්වරුන්ගේ යන්ත්‍රෝපකරණ විෂය භාර නිලධාරී මහතා ගේ අධීක්ෂණය යටතේ මේවා කරන්න.අපේ රියදුරු මහත්වරුන්ට මේ යන්ත්‍ර නඩත්තු කිරීම පිළිබඳව අවබෝධයක් අවශ්‍යයි.ඒ සඳහා වැඩමුළුවක් පවත්වන්න පුළුවන්.මේ යන්ත්‍ර සූත්‍ර ගෙවීම සාමාන්‍ය දෙයක්.හැබැයි හරියට නඩත්තුවක් වෙන්නේ නැති නම් ඒවා ඉක්මනින් ප්‍රයෝජනයට ගත නොහැකි තත්ත්වයට පත් වෙනවා.ඒ නිසා ඒ සම්බන්ධව වැඩි අවධානයක් යොමු කරමු කියලා ඉල්ලා සිටිනවා.

ඒ වගේම අපි පසුගිය දිනක ත්‍රී විල් රථ සංගමයේ රැස්වීමක් පැවැත්වූවා.ඒ අය බොහෝම සරල දේවල් ටිකක් අපෙන් ඉල්ලන්නේ.ඒ අයගෙන් සභාවට ආදායමක් එනවා.ඒ වගේම ඒ අයට තමන්ගේ වෘත්තිය ඉතාම ගෞරවාන්විතව කරන්න පුළුවන් රැකියාවක්.ඒ අය අපේ ප්‍රාදේශීය සභාවේ ලියාපදිංචි වී සිටින නිසා ඒ අය හැඳුනුම්පතක් ඉල්ලනවා.ඊ ළඟට ඒ ත්‍රී වීල් රථ ගාල් කරන ස්ථානය ත්‍රී වීල් රථ වලට වෙන් කරලා දැන්වීමක් ත්‍රී වීල් රථ ගාල් කරන ස්ථානවල සකස් කර දෙන ලෙස ඉල්ලීම් කලා.ඒ වගේම ඒ ත්‍රී වීල් හඳුනා ගැනීම සඳහා පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ නාමයත් එක්ක ස්ටිකර් එකක් ලබා දෙන්න කීවා.මේ සියලු කාරණා සිදු කරන ආකාරය පිළිබඳව ඒ අයගේත් එතුමන්ලාගේත් අදහස් අරන් අපි සාකච්ඡා කරලා සුදුසු ආකාරයට කටයුතු කරමු.

## 03. ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ,පෙත්සම්,පැමිණිලි හා සංනිවේදන.

### I. පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ 2021.12.31 දිනට ඉදිරිපත් කර ඇති ගිණුමේ ශේෂ පත්‍රය ගැසට් පත්‍රයේ පල කිරීම.

<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>

පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ 2021.12.31 දිනට ඉදිරිපත් කර ඇති ගිණුමේ ශේෂ පත්‍රය භාෂාත්‍රයෙන් ගැසට් පත්‍රයේ පල කිරීම සඳහා වූ විශේෂ යෝජනාවක් ගරු සභාවට ඉදිරිපත් වී තිබෙනවා. එම යෝජනාව විශේෂ යෝජනා යටතේ ඉදිරිපත් කිරීම සඳහා යෝජනා ස්ථිර කරන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩී. නිමාලි දිල්හානි මෙනවිය - (ශ්‍රී.ල.පො.ජ.පෙ.)</u>

පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ 2021.12.31 දිනට ඉදිරිපත් කර ඇති ගිණුමේ ශේෂ පත්‍රය භාෂාත්‍රයෙන් ගැසට් පත්‍රයේ පල කිරීම සඳහා වූ විශේෂ යෝජනාවක් විශේෂ යෝජනා යටතේ ඉදිරිපත් කිරීම සුදුසු බව මා යෝජනා කරනවා.

<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එල්.එම්.ගුණරත්මැණිකා මහත්මිය - (එ.ජා.ප.)</u>

එම යෝජනාව මා ස්ථිර කරනවා.

<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>

පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ 2021.12.31 දිනට ඉදිරිපත් කර ඇති ගිණුමේ ශේෂ පත්‍රය භාෂාත්‍රයෙන් ගැසට් පත්‍රයේ පල කිරීම සඳහා වූ විශේෂ යෝජනාවක් විශේෂ යෝජනා යටතේ ඉදිරිපත් කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ 2021.12.31 දිනට ඉදිරිපත් කර ඇති ගිණුමේ ශේෂ පත්‍රය භාෂාත්‍රයෙන් ගැසට් පත්‍රයේ පල කිරීම සඳහා වූ විශේෂ යෝජනාවක් විශේෂ යෝජනා යටතේ ඉදිරිපත් කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාව ඒකමතිකව සභා සම්මත කරන ලදී.**

### II. ඓතිහාසික නුවර දළදා පෙරහැරේ දන්ත ධාතූන් වහන්සේ වැඩම කල නැදුන්ගමුවේ ඇත් රජිඳා වෙනුවෙන් ශෝකය ප්‍රකාශ කිරීම හා ජාත්‍යන්තර කාන්තා දිනය වෙනුවෙන් අදහස් දැක්වීම.

<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>

ඓතිහාසික නුවර දළදා පෙරහැරේ දන්ත ධාතූන් වහන්සේ වැඩම කල නැදුන්ගමුවේ ඇත් රජිඳා වෙනුවෙන් ශෝකය ප්‍රකාශ කිරීම හා ජාත්‍යන්තර කාන්තා දිනය වෙනුවෙන් අදහස් දැක්වීම සඳහා විශේෂ යෝජනාවක් ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩී. නිමාලි දිල්හානි මෙනවිය ගරු සභාවට ඉදිරිපත් කර තිබෙනවා.එම යෝජනාව විශේෂ යෝජනා යටතේ ඉදිරිපත් කිරීම සඳහා යෝජනා ස්ථිර කරන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩී. නිමාලි දිල්හානි මෙනවිය - (ශ්‍රී.ල.පො.ජ.පෙ.)</u>

ඓතිහාසික නුවර දළදා පෙරහැරේ දන්ත ධාතූන් වහන්සේ වැඩම කල නැදුන්ගමුවේ ඇත් රජිඳා වෙනුවෙන් ශෝකය ප්‍රකාශ කිරීම හා ජාත්‍යන්තර කාන්තා දිනය වෙනුවෙන් අදහස් දැක්වීම සඳහා විශේෂ යෝජනාවක් විශේෂ යෝජනා යටතේ ඉදිරිපත් කිරීම සුදුසු බව මා යෝජනා කරනවා.

<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එල්.එම්.ගුණරත්මැණිකා මහත්මිය - (එ.ජා.ප.)</u>

එම යෝජනාව මා ස්ථිර කරනවා.

ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා

ඓතිහාසික නුවර දළදා පෙරහැරේ දන්ත ධාතූන් වහන්සේ වැඩම කල නැදුන්ගමුවේ ඇත් රජිදා වෙනුවෙන් ශෝකය ප්‍රකාශ කිරීම හා ජාත්‍යන්තර කාන්තා දිනය වෙනුවෙන් අදහස් දැක්වීම සඳහා විශේෂ යෝජනාවක් විශේෂ යෝජනා යටතේ ඉදිරිපත් කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව ඓතිහාසික නුවර දළදා පෙරහැරේ දන්ත ධාතූන් වහන්සේ වැඩම කල නැදුන්ගමුවේ ඇත් රජිදා වෙනුවෙන් ශෝකය ප්‍රකාශ කිරීම හා ජාත්‍යන්තර කාන්තා දිනය වෙනුවෙන් අදහස් දැක්වීම සඳහා විශේෂ යෝජනාවක් විශේෂ යෝජනා යටතේ ඉදිරිපත් කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාව ඒකමතිකව සභා සම්මත කරන ලදී.**

## III. නිවාඩු අනුමත කිරීම.

ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා

ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ටී.එම්. ජාබීර් මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඒ.පී.තරංග චම්පික අලහකෝන් මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එච්.එම්.කමල්සිරි මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනි එච්.එම්.උදේශිකා මාධවී හේරත් මහත්මිය හා ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඒ.පී.සචින්තා අමාලි මෙනවිය

වෙත නිවාඩු අනුමත කර න මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනී ඒ.එන්.පද්මා වීරසිංහ මහත්මිය - (එ.ජා.ප.)

ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ටී.එම්. ජාබීර් මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඒ.පී.තරංග චම්පික අලහකෝන් මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එච්.එම්.කමල්සිරි මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එච්.එම්.උදේශිකා මාධවී හේරත් මහත්මිය හා ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනි ඒ.පී.සචින්තා අමාලි මෙනවිය

වෙත අද දින සභාවේ නිවාඩු අනුමත කිරීම සුදුසු බව මා යෝජනා කරනවා.

ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එල්.එම්.ගුණරත්මැණිකා මහත්මිය - (එ.ජා.ප.)

එම යෝජනාව මා ස්ථිර කරනවා.

ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා

ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ටී.එම්. ජාබීර් මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඒ.පී.තරංග චම්පික අලහකෝන් මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එච්.එම්.කමල්සිරි මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එච්.එම්.උදේශිකා මාධවී හේරත් මහත්මිය හා ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනි ඒ.පී.සචින්තා අමාලි මෙනවිය

වෙත අද දින සභාවේ නිවාඩු අනුමත කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ටී.එම්. ජාබීර් මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඒ.පී.තරංග චම්පික අලහකෝන් මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එච්.එම්.කමල්සිරි මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනි එච්.එම්.උදේශිකා මාධවී හේරත් මහත්මිය හා ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඒ.පී.සචින්තා අමාලි මෙනවිය**

**වෙත අද දින සභාවේ නිවාඩු අනුමත කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාව ඒකමතිකව සභා සම්මත කරන ලදී.**

## IV."වෙනසකට මගක්" - පැෆ්රල් පුහුණු සැසිය.

පැෆ්රල් සංවිධානය විසින් ශ්‍රී ලංකාවේ කාන්තා දේශපාලන ක්‍රියාකාරිත්වය ඉහළ නැංවීම අරමුණු කර ගනිමින් විශේෂයෙන්ම පාර්ලිමේන්තු,පළාත් සභා හා පළාත් පාලන ආයතන තුළ කාන්තා නියෝජනය ප්‍රමාණාත්මකව හා ගුණාත්මකව ඉහළ නැංවීම සඳහා පුහුණු පාඨමාලාවක් දිවයිනේ සියලුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි සිදු කිරීමට සැලසුම් කර ඇති බවත්,ඒ සඳහා පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ ගරු මන්ත්‍රිනි අයි.සද්නා දිල්හානි ප්‍රනාන්දු මහත්මිය තේරී පත් වී ඇති බවත් දන්වමින්,මෙම පුහුණු සැසිය සඳහා සහභාගී වන එම මන්ත්‍රීවරියන් දිරිමත් කරන ලෙසත්,පුහුණුව සාර්ථකව නිම කර ගනිමින් දැනුමෙන් සන්නද්ධ වීමට අවශ්‍ය සහයෝගය සහ මගපෙන්වීම නිරන්තරයෙන් ලබා දෙන ලෙසත් ඉල්ලා සිටිමින්

පැෆ්රල් සංවිධානය විසින් "වෙනසකට මගක්" - පැෆ්රල් පුහුණු සැසිය යන මැයෙන් හා 2022.01.31 දාතමින් ඉදිරිපත් කර ඇති ලිපිය ගරු සභාපතිතුමා විසින් ගරු සභාවට ඉදිරිපත් කරන ලදී.

## V.රැකියා අවස්ථාවන් පිළිබඳ දැනුවත් කිරීම.

ප්‍රියන්ත විජේරත්න,ප්‍රාදේශීය කළමනාකරු,යූනියන් ඇෂුවරන්ස් පී.එල්.සී.,කුලියාපිටිය විසින් ජෝන් කීල්ස් සමූහයට අයත් යූනියන් ඇෂුවරන්ස් සමාගමේ කුලියාපිටිය ප්‍රාදේශීය කාර්යාලයට තදාසන්න හෙට්ටිපොල ප්‍රදේශයේ ඇති රැකියා පුරප්පාඩු සම්බන්ධව ඉදිරිපත් කර ඇති ලිපිය ගරු සභාපතිතුමා විසින් ගරු සභාවට ඉදිරිපත් කරන ලදී.

## VI.දූනුපොත ප්‍රජා ජල ව්‍යාපෘතියේ ජල සබඳතාවය පිළිබඳව.

ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා

පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව, සංවර්ධන නිළධාරී,එම් .ඩබ්.අජන්තා කුමාරි මිය විසින් **දූනුපොත ප්‍රජා ජල ව්‍යාපෘතියේ ජල සබඳතාවය පිළිබඳව ලිපියක් මහා සභාවට ඉදිරිපත් කර තිබෙනවා.එමඟින්** පඩුවස්නුවර බල ප්‍රදේශයේ දූනුපොත ග්‍රාම නිළධාරී වසමේ ක්‍රියාත්මක ජල ව්‍යාපෘතිය මේ වන විට අක්‍රීය මට්ටමේ ඇති බවත්,මෙම ජල ව්‍යාපෘතිය අඩු පාඩු සොයා බලා නැවත යාවත්කාලීන කිරීමේ අරමුණින් කිහිපවතාවක්ම ප්‍රදේශවාසීන් කැඳවා රැස්වීම් පවත්වා තිබූ අතර ඒ සඳහා මහ ජනතාව සහභාගී නොවීම හේතුවෙන් එය අසාර්ථක වී ඇති බවත්,2022.03.06 දිනද නැවත වතාවක් ඉහත අරමුණින් ගරු සභාපති තුමාගේ ප්‍රධානත්වයෙන් වයඹ ජල හා සනීපාරක්ෂක ඒකකයේ නිළධාරී සහ විෂය භාර නිළධාරී සහභාගී වූ අතර ජල පාරිභෝගිකයන් තුන්දෙනෙක් පමණක් සහභාගී වීම හේතුවෙන් මෙවරද සාකච්ඡාව අසාර්ථක වූ බවත්,මෙම අවස්ථාවට පෙර සිටි නිළධාරීන් කිසිවෙකු සහභාගී නොවූ නිසා පොත් පත් සහ ලේඛන වල (මූලා තොරතුරු) දැනගැනීමට නොහැකි වූ බවත්,සහභාගීත්වය අඩුවීමට හේතුව සියලු දෙනාම ළිං ඉදිකර ඇති නිසා ජල අවශ්‍යතාවය සපුරාගෙන ඇති නිසා බවත්,ප්‍රදේශවාසීන් මෙය නැවත යථාවත් කරන ලෙස ඉල්ලීම් කරන්නේද නැති අතර ,මෙම ව්‍යාපෘතියේ ජල මෝටර් ඇතුළු අනෙකුත් දේ සහ ලිපි ලේඛන ප්‍රාදේශීය සභාව වෙත භාර දීමට ව්‍යාපෘතියේ කිසිඳු නිළධාරියෙකු ඉදිරිපත් වී ද නොමැති බවත් සඳහන් කරමින් මේ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදු කිරීම සඳහා උපදෙස් ලබා දෙන ලෙස ඉල්ලා තිබෙනවා.

ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ආර්.පී.සරත්චන්ද්‍ර ජයතිලක මහතා - (ශ්‍රී.ල.පො.ජ.පෙ.)

ගරු සභාපතිතුමනි, මෙම ව්‍යාපෘතිය ප්‍රජා ජල සංවිධාන හරහා ක්‍රියාත්මක වුනේ.ඒ ක්‍රියාත්මක වෙද්දී මේ ව්‍යාපෘතියේ ළිං දෙකක් ඉදි කලා.එකක් දූනුපොත පහල ඉදිකලා.අනෙක් එක දූනුපොත වැව් වානට ආසන්නයේ ඉදිකළා.සෑම අවස්ථාවකම පානීය ජලය අවශ්‍ය වෙන්නේ ජලය නැති අවස්ථාවල.ජලය නැති අවස්ථාවල මෙම ජල ව්‍යාපෘතිය ක්‍රියාත්මක වුණත් සෑම නිවසකම වගේ වතුර තිබුණා.මේ මඟින් ජනතා අවශ්‍යතාව ඉටු වුණේ නෑ කියන එක සිහිපත් කරන්න ඕන.ප්‍රධාන ළිං දෙකක් ඉදි කළා.එක ළිඳකට පමණයි විදුලි බලය ලබා ගන්න හැකි වුණේ.ඒ ළිඳෙන් තමයි ජනතාවට වතුර ලබා දුන්නේ.අලුතෙන් හදලා තිබෙන ළිඳට විදුලි බලය ලබා දෙන්න.මේකට අවශ්‍ය කරන විදුලි මෝටරයකුත් තිබෙනවා.නමුත් ඒකට විදුලි බල මණ්ඩලයෙන් ධාරිතාව ප්‍රමාණවත් මදි කියලා විදුලිය ලබා දෙන්නේ නෑ.ධර්මසිරි දසනායක මැතිතුමා ළඟට ගිහිනුත් ජනතාව විදුලි බල මණ්ඩලයෙන් විදුලිය ලබා දෙන ලෙස ඉල්ලීම් කලා.නමුත් එතුමන්ලා විදුලිය ලබා දුන්නේ නෑ.ඒ නිසා නියං කාලයට මේ ජල මූලාශ්‍රයෙන් වතුර දෙන්න බැරි වෙනවා.ජනතාවගේ මූලික අවශ්‍යතාවක් පානීය ජලය.ඉන් පසු ජනතාවට සිදු වෙන්නේ ළිං ඉදි කර ගැනීමට උත්සාහ දැරීමයි.ඒ නිසා අද වන විට සෑම නිවසකම වගේ නල ළිඳක් තිබෙනවා.මේක සක්‍රීය කරලා ක්‍රියාත්මක කල යුතු මට්ටමට ගෙන ආවොත් ඒ අය මේක ක්‍රියාත්මක කරගෙන යන්න කැමතියි.මුලින් අපි හිටපු ගරු සභාපතිතුමා එක්ක සාකච්ඡා වට දෙකක් පැවැත්වූවා.ඒ වෙලාවේ තිබුණේ රුපියල් පනස් දහසක,ලක්ෂයක වගේ වියදමක්.හංවැල්ල රත්මල්ල ගල්කන්ද මාර්ගය හදනවා අයිරෝඩ් ව්‍යාපෘතියෙන්.මේ මාර්ගය මැද්දෙන් බට යවලා තිබෙනවා.මේ සමහර බට තිබෙන්නේ උඩ.ගල් උඩින් සමහර බට දාලා තිබෙන්නේ.ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොවන නිසා මේ බට කැඩිලා විනාශ වෙලා තිබෙනවා.දූනුපොත වැවේ බන්ට් එක දිගටම මීටර් පන්සියයක් හයසියයක් දූනුපොත පිරිවෙන අසල ඉඳන් මේවා ගලවලා අයින් කර ගන්න කීවා මාර්ග සංවර්ධන අධිකාරියෙන් ඇවිත්.ළිඳේ ඉඳන් ටැංකියට වතුර ආවා.දැන් එහෙම එන්නේත් නෑ.ඒ නිසා මේක ක්‍රියාත්මක කරනවා නම් ජනතාවට මේ ගැන අවශ්‍යතාව තිබෙනවා.ජනතාව එන්නේ නැත්තේ විශ්වාසය පළුදු වීම නිසයි.ඉස්සරලාම ජල සමිතියට අපි ගිය වෙලාවේ පනහක් හැටක් ඇවිත් හිටියා.දෙවෙනියට යද්දී විසි පහයි,තිහයි.අපේ පැත්තෙනුත් යමක් කෙරෙන්නේ නෑ.ඒ පැත්තෙනුත් අකර්මන්‍ය වෙනවා.සම්පත් විශාල ප්‍රමාණයක් විනාශ වෙලා යනවා.ජලය ලීටර් 30,000 ක් විතර ගබඩා කරන්න පුළුවන් ටැංකියක් තිබෙන්නේ.වතුර තිබුණේ නැතිනම් මේ අධික රස්නයට ඒ ටැංකියත් විනාශ වෙලා යනවා.මෝටර් පාවිච්චි කලේ නැතිනම් ඒවාගෙත් මල බැඳිලා විනාශ වෙලා යනවා.සභාවේ තාක්ෂණ නිලධාරීන් යොදවලා අපි සාකච්ඡා කරලා මේකට විසඳුමක් ගමු.ඒ අය කියන්නේ මේක සභාවට පවරාගෙන මේක නඩත්තු කරලා

විධිමත් ආකාරයට පානීය ජලය ලබා දෙන්න කියලායි.ජලය ලබා ගන්න කැමතියි,ඒකට ගැලපෙන මිලක් අපෙන් අය කරන්න කියලායි ඒ අය කියන්නේ. ප්‍රජා මූල සංවිධානයේ සභාපතිතුමා ලිඛිතව දැනුම් දීලා තිබෙන්නේ විදුලිබල මණ්ඩලයට විදුලිය විසන්ධි කරන්න කියලා.නමුත් ඒ අය විසන්ධි කරන්නේ නෑ.අපි සාකච්ඡා කරද්දී විදුලි බිල රුපියල් 12,000.00 ක් තිබුණේ.දැන් රු.43,000.00 වෙලා.ඒ නිසා අපේ කාර්මික නිලධාරීනුත් සම්බන්ධ කරගෙන ඉතාමත් කෙටි කාලීනව මේකට විසඳුමක් කලොත් මේක රැක ගන්න පුළුවන්.ඒ ප්‍රදේශයේ ජනතාවගේ ලොකු උනන්දුවක් අවශ්‍යතාවක් තිබෙනවා මේ ගැන.

<u>ගරු උප සභාපති රංජිත් ආනන්ද බණ්ඩාර මහතා</u>

ගරු සභාපතිතුමණි,ඔබතුමාට මතක ඇති 2007 වර්ෂයේ ව්‍යාපෘති 12 ක් ආවා.සනීපාරක්ෂක හා පානීය ජල ව්‍යාපෘති.අපිට ඒ වෙලාවේ මේවා කරනකොට විදුලිය සම්බන්ධව අපිට අවබෝධයක් තිබුණේ නෑ.එතකොට මේක හරි ගැටළුවක්.ජනතාවට පායන කාලයටයි ජලය අවශ්‍ය වෙන්නේ.පායන කාලයට එක ළිඳක් හිඳෙනවා,අනෙක් ළිඳේ ජලය ගන්න විදිහක් නෑ විදුලිය ප්‍රශ්නය එනවා.ඒක හරිම බැරෑරුම් කාරණාවක්.

- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එච්.එම්.ජයන්ත හේරත් මහතා පෙ.ව.11.05 ට පමණ ගරු සභාවෙන් බැහැරට ගියා.
- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ටී.එම්.ප්‍රදීප් සමන් කුමාරසිරි තෙන්නකෝන් මහතා පෙ.ව.11.05 ට පමණ ගරු සභාවෙන් බැහැරට ගියා.

සභාවට පවරා ගන්නවා නම් ලක්ෂ පහක් වෙන් කරලා මේ වැඩේ කරන්න බෑ.ලොකු වියදමක් දරන්න වෙනවා.අනෙක් කාරණය විදුලියේ ප්‍රශ්නය කෙසේ වෙතත් ළිඳ හදන්නේ ජල මූලාශ්‍රයක් තිබෙන තැනනේ.ජල සම්පාදන මණ්ඩලයෙන් ඇවිත් පරීක්ෂා කරලා මේ මේ තැන් වල ජලය තිබෙන්නේ කියලා නිර්දේශ කලාට පසුව ඒ නිර්දේශයන් අනුව තමයි ළිඳ කපන්න වෙන්නේ.හැබැයි ඒ නිර්දේශ කල තැනට ට්‍රාන්ස්පෝමරයේ ඉඳන් මීටර් 1200 කට වඩා දුරකට වැඩි වෙන්න පුළුවන්.ඔය වගේ ප්‍රායෝගික ගැටළු තිබෙනවා.ඒ නිසා මේක පුළුල් විදිහට සාකච්ඡා කරලා ඒ ජනතාවට පානීය ජලය ලබා දීමට සාධනීය විසඳුමක් දෙන්න ඕන.

<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ආර්.පී.සරත්චන්ද්‍ර ජයතිලක මහතා - (ශ්‍රී.ල.පො.ජ.පෙ.)</u>

ගරු සභාපතිතුමා,හංවැල්ලෙත් මේ වගේ තව ළිඳක් තිබෙනවා.

<u>ගරු උප සභාපති රංජිත් ආනන්ද බණ්ඩාර මහතා</u>

ගරු සභාපතිතුමා,අපේ හිඳච ජල ව්‍යාපෘතියත් අක්‍රීයයි.

<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ජේ.පී.නිශාන්ත දේශප්‍රිය ජයලත් මහතා - (එ.ජ.නි.ස.)</u>

අපේ ලේකම්තුමා දන්නවා බණ්ඩාරකොස්වත්තට ආව ප්‍රශ්නය මේ ජලය සම්බන්ධව.ජාති භේදය ඇති වෙන්න ගියා මේ ජලය නිසා.අපි ඒ ගැන කතා කරලා විසඳ ගත්තා.එහෙම විසඳන්න පුළුවන් මේ දුනුපොත ප්‍රශ්නයත්.මෙම ජල ව්‍යාපෘතිය සභාවට සම්බන්ධයිද?ගරු සභාපතිතුමා,මේක ජල සම්පත් අමාත්‍යාංශයට යොමු කිරීම සුදුසුයි.

- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එච්.එම්.ජයන්ත හේරත් මහතා පෙ.ව.11.10 ට පමණ ගරු සභාවට පැමිණියා.
- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ටී.එම්.ප්‍රදීප් සමන් කුමාරසිරි තෙන්නකෝන් මහතා පෙ.ව.11.10 ට පමණ ගරු සභාවට පැමිණියා.

<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>

ගරු මන්ත්‍රීවරුණි,දුනුපොත ජල ව්‍යාපෘතිය සම්බන්ධව ඔබතුමන්ලා කරුණු ඉදිරිපත් කලා.මේ දුනුපොත ජල ව්‍යාපෘතියේ ජලය අවශ්‍ය කී දෙනෙක් ඉන්නවාද අපි සොයා බැලුවා.ඇවිත් හිටියේ තුන් දෙනයි.ඒ ආව අය අපිට කීවා මේ ජල ව්‍යාපෘතිය සභාවට පවරාගෙන කරන්න කියලා.මම ඒ වෙලාවේත් කීවා මේක ප්‍රායෝගික නෑ.මේක වඩාත්ම ප්‍රායෝගික වෙන්නේ ගමේ ස්වේච්ඡා සංවිධානයක් හරහා සිදු කිරීමයි.එහෙම ක්‍රියාත්මක කරන ජල සමිති තිබෙනවා.ඕන නම් ඒ ජල සමිතියට ආදායම් මාර්ගයක් හැටියට අවශ්‍ය උපදෙස් ලබා දෙන්න පුළුවන්,ජල සම්පාදන මණ්ඩලයෙන් අවශ්‍ය උපදෙස් ගන්නත් පුළුවන්,ෆිල්ටර් කරන ලද වතුර ජනතාවට බෙදා හරින්න ක්‍රමයක්.එතකොට ඒ සමිතියට ආදායමකුත් එනවා.ඉදිරියේ දී මේ අයගේ රැස්වීමක් තිබෙනවා. ගරු මන්ත්‍රී ආර්.පී.සරත්චන්ද්‍ර ජයතිලක මහතා,ඔබතුමාත් ඒ අවස්ථාවට යන්න.අපි සභාවෙ මේ සම්බන්ධව කතා කල බවට ඒ අය දැනුවත් කරලා ඒ අයගේ අදහස් ලබා ගන්න.ඔබතුමන්ලාත් මැදිහත් වෙලා විදුලි බල මණ්ඩලයට කතා කරලා විදුලිය විසන්ධි කිරීමට පියවර ගන්න.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ආර්.පී.සරත්චන්ද්‍ර ජයතිලක මහතා - (ශ්‍රී.ල.පො.ජ.පෙ.)**

ගරු සභාපතිතුමණි,මට ඔතනට යන්න පුළුවන්.ප්‍රශ්නයක් නෑ.ඒ අය ඉල්ලන දේ තමයි මේක දැන් අක්‍රීය වෙලානේ තිබෙන්නේ.ඒ නිසා මේක සක්‍රීය කරලා දෙන්න කියලා තමයි ඉල්ලීම කරන්නේ.අපි අපේ තාක්ෂණ නිලධාරී මහතුන් යොදවලා දළ ඇස්තමේන්තුවක් හෝ හදලා මෙන්න මේ විදිහට කරලා දෙන්න පුළුවන් කියලා එකඟතාවකට ආවොත් ජනතාව උනන්දු කරලා මේක කරන්න පුළුවන්.සභාවේ නිලධාරී මහතකු හෝ යොදවලා මේකේ සම්පූර්ණ සක්‍යතා වාර්තාවක් අපි ගන්න ඕන.ඉන් පසුව අපි තීරණය කරන්න ඕන මේකට මොකද කරන්නේ කියලා.ගම්වල ගමේ සම්පත් වලට ආදරය කරන මිනිස්සු ඉන්නවානේ.මේක සිදු කරන ආකාරය පිළිබඳව කතා කරලා අපේ පැත්තෙන් යම් දායකත්වයක් ලබා දෙන්න වෙනවා.

- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩී.එම්.සුනිල් හේමචන්ද්‍ර දිසානායක මහතා පෙ.ව.11.15 ට පමණ ගරු සභාවෙන් බැහැරට ගියා.

**ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා**

ගරු මන්ත්‍රීවරුණි,ඔබතුමන්ලා හොඳ අදහස් ටිකක් ඉදිරිපත් කලා.ඉදිරියේ දී ඒ අය පවත්වන මහා සභා රැස්වීමට සම්බන්ධ වී එහි දී පැහැදිලිව හඳුනා ගන්න වතුර අත්‍යවශ්‍ය කී දෙනෙක් ඉන්නවාද කියලා.ඒකට ඔබතුමා මැදිහත් වෙන්න.ඒ ඉන්න ප්‍රමාණය අනුව අපි ඊළඟ අඩියරට යමු.

## VII. 2022 අප්‍රේල් මස මහා සභාව පැවැත්වීම.

**ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා**

2022 අප්‍රේල් මස 12 වන දින පැවැත්වීමට නියමිතව තිබූ අප්‍රේල් මස මාසික මහා සභා රුැස්වීම 2022 අප්‍රේල් මස 08 වන දින පැවැත්වීම සඳහා යෝජනා ස්ථිර කරන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩී. නිමාලි දිල්හානි මෙනවිය - (ශ්‍රී.ල.පො.ජ.පෙ.)**

2022 අප්‍රේල් මස 12 වන දින පැවැත්වීමට නියමිතව තිබූ අප්‍රේල් මස මාසික මහා සභා රුැස්වීම 2022 අප්‍රේල් මස 08 වන දින පැවැත්වීම සුදුසු බව මා යෝජනා කරනවා.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එල්.එම්.ගුණරත්මැණිකා මහත්මිය - (එ.ජා.ප.)**

එම යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා**

2022 අප්‍රේල් මස 12 වන දින පැවැත්වීමට නියමිතව තිබූ අප්‍රේල් මස මාසික මහා සභා රුැස්වීම 2022 අප්‍රේල් මස 08 වන දින පැවැත්වීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව 2022 අප්‍රේල් මස 12 වන දින පැවැත්වීමට නියමිතව තිබූ අප්‍රේල් මස මාසික මහා සභා රුැස්වීම 2022 අප්‍රේල් මස 08 වන දින පැවැත්වීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාව ඒකමතිකව සභා සම්මත කරන ලදී.**

## 04ථා පරිදි කල් දී ඇති ප්‍රශ්න - නැත

## 05.යථා පරිදි කල් දී ඇති යෝජනා

## I.වත්මන් රජය මඟින් කොට්ඨාසයකට අදාල ප්‍රාදේශීය හා මන්ත්‍රීවරුන්ට ලබා දෙන රුපියල් ලක්ෂ 40 ක මුදල සභාව නියෝජනය කරන නිදහස් පක්ෂයේ සියලු මන්ත්‍රීවරුන්ට ද ලබා දීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටීමේ යෝජනාව.

**ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා**

වත්මන් රජය මඟින් කොට්ඨාසයකට අදාල ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ට ලබා දෙන රුපියල් ලක්ෂ 40 ක මුදල සභාව නියෝජනය කරන නිදහස් පක්ෂයේ සියලු මන්ත්‍රීවරුන්ට ද ලබා දීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටීමේ යෝජනාවක් ගරු මන්ත්‍රී ටී.ආර්.එම්.අපර්ණ නිලුපුල් සේනාරත්න මහතා විසින් ඉදිරිපත් කර තිබෙනවා.ඒ සඳහා එතුමාට අවස්ථාව ලබා දෙනවා.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ටී.ආර්.එම්.අපර්ණ නිලුපුල් සේනාරත්න මහතා - (එ.ජ.නි.ස.)**

වත්මන් රජය මඟින් කොට්ඨාසයකට අදාල ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ට ලබා දෙන රුපියල් ලක්ෂ 40 ක මුදල සභාව නියෝජනය කරන නිදහස් පක්ෂයේ සියලු මන්ත්‍රීවරුන්ට ද ලබා දීමට කටයුතු කිරීම සුදුසු බව මා යෝජනා කරනවා.මේ වත්මන් රජය තුළ හවුල්කාර පක්ෂයක් විදියට ඉන්න ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නියෝජනය කරන මන්ත්‍රීවරු 1087ක් විතර ඉන්නවා.මේ 1087 වෙනුවෙන් තමයි අද දින මම මේ යෝජනාව ගෙන ආවේ.මම ඉල්ලා සිටින්නේ මේ සම්බන්ධව වත්මන් ජනාධිපතිතුමා,අගමැතිතුමා,ඒ වගේම මුදල් අමාත්‍ය බැසිල් රාජපක්ෂ මැතිතුමාට මේ සම්බන්ධව නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ අදහස් ලිඛිතවම යවන්න.අපි මේ 2018 පෙබරවාරි 10 වන දින මේ පැවැත්වුණු ඡන්ද ක්‍රමයත් එක්ක 2017/17 දරණ ප්‍රදේශීය සභා පනතත් එක්ක 60% - 40% කියන ඡන්ද ක්‍රමයත් එක්ක තමයි මේ කොට්ඨාස ඡන්ද ක්‍රමය ආවේ.මේ කොට්ඨාස ඡන්ද ක්‍රමය එන්න කලින් මේ සභාවේ අපි දන්නවා මන්ත්‍රීවරු 22 ක් හිටියා.පැරණි ඡන්ද ක්‍රමයත් එක්ක මුළු ලංකාවේම මන්ත්‍රීවරු හිටියේ 4486 යි.මේ සංශෝධනය වූ ඡන්ද ක්‍රමය තුල දී පළාත් පාලන සභිකයින් 8356 දක්වා වැඩි උනා.වැඩි වූ සභිකයින් ගණන 3870 ක්.හැබැයි රජයක් විදියට මේ පළාත් පාලන ක්‍රමය තුල සභිකයින් වැඩි කරලා බලාපොරොත්තු වුණේ ගම තුලට සංවර්ධනය ගෙන යන්නයි.නැතිව වැඩි වූ සභිකයින්ට දීමනා ගෙවලා තියාගෙන ඉන්න නෙවෙයි.පසුගිය ජනාධිපතිවරණයේ අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාට හවුල්කාර පක්ෂ විදියට ඒ වෙලාවේ පක්ෂ 15 ක් හිටියා.ඒ පක්ෂ 15 ම එකතු වෙලා එතුමා වෙනුවෙන් වැඩ කලා.ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මහ ලේකම් ගරු දයාසිරි ජයසේකර මැතිතුමා,ඒ වගේම වත්මන් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා එක්ව ගිවිසුම් සහගතව ඉදිරි කාලය තුල කොහොමද අපි වැඩ කරන්නේ කියන ගිවිසුමට එළඹුනා. ගරු දයාසිරි ජයසේකර මැතිතුමා ගිවිසුම් ගත වුණේ අද ඉන්න ජනාධිපතිතුමා එක්ක. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරු 1087 ට අදාලව මේ වන තුරුත් කිසිම ප්‍රතිපාදනයක් ලබා දී නෑ.

- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩී.එම්.සුනිල් හේමචන්ද්‍ර දිසානායක මහතා පෙ.ව.11.24 ට පමණ ගරු සභාවට පැමිණියා.

පඩුවස්නුවර ආසනය ගත්තාම ශ්‍රී ලංකා පොදුජන පෙරමුණට කොට්ඨාස 18 ක්,කොට්ඨාස 03 ක් එක්සත් ජාතික පක්ෂයට හා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට එක් කොට්ඨාසයක් තිබෙනවා.කොට්ඨාස ජයග්‍රහණය කල මන්ත්‍රීවරුන්ට ලක්ෂ 40 ගානේ ලබා දෙනවා.මෙච්චර මුදලක් තිබෙනවා නම් මේ ආණ්ඩුව නියෝජනය කරන ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නියෝජනය කරන මන්ත්‍රීවරුන්ට අඩුම තරමේ පක්ෂ 10 ක් වත් ලබා දෙන්න ඕන. වත්මන් ජනාධිපතිතුමා සමඟ ගිවිසුම් ගත වූ ප්‍රධාන පක්ෂයක් විදියට ශ්‍රී ලංකා නිදහස් පක්ෂ මන්ත්‍රීවරුන්ටත්,අපේක්ෂකයන්ටත් සලකනවා කියන කොන්දේසි මාලාව සමඟ ගිවිසුම් ගත වෙලායි මෙතනට ආවේ.අඩුම තරමේ අද අපේක්ෂකයෝ අමතක කරලා,ඡන්දය ඉල්ලපු මන්ත්‍රීවරු ටික අමතක කරලා.ඉහල ඉන්න අපේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ටත් ප්‍රතිපාදන ලැබෙන්නේ නෑ.වත්මන් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාට,මහින්ද රාජපක්ෂ ගරු අගමැතිතුමාට,මුදල් ඇමතිතුමාට මේ රජය මෙහෙයවන්න යුතුකමක් තිබෙනවා.ආණ්ඩුව හදන්න කැප වූ හවුල්කාර පක්ෂයට පයින් ගහලා යනවා නම් ඒක අපි අනුමත කරන්නේ නෑ.අඩුම තරමේ ඉඳි කට්ටක තරම් දෙයක්වත් ගරු ජනාධිපතිතුමා,ගරු අගමැතිතුමා ප්‍රමුඛ මේ ආණ්ඩුව තුල ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නියෝජනය කරන පළාත් පාලන මන්ත්‍රීවරුන්ට දෙන්නේ නෑ.ගම් මට්ටමේ ඉන්න ක්‍රියාකාරී සභිකයෝ පසුගිය ජනාධිපතිවරණයට,පසුගිය පාර්ලිමේන්තු මැතිවරණයට මේ අයට තුනෙන් දෙකක බලයක් ලැබෙන තැනට වැඩ කරන්න කටයුතු කලා.වත්මන් රජයේ හවුල්කාර පක්ෂයක් විදියට රජය ගෙන යන ආර්ථික වැඩසටහන් වලට ආරාධනා නොකරන තත්ත්වයකට අද ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නියෝජනය කරන මන්ත්‍රීවරුන් පත් වෙලා තිබෙනවා.යුතුකමක් තිබෙනවා අන්තිම මොහොතේ හෝ මේ ආණ්ඩුවට මතක් කරන්න ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛ බලවේග ටික තමයි මේ ආණ්ඩුව බිහි කරන්න කටයුතු කලේ කියන එක.ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මහ ලේකම්තුමා ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ සංවිධානය කල කිසිම වේදිකාවකට නගින්නේ නැතිව, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුහා සංවිධායකයින් එකතුව තනපු වේදිකාවල ඉඳන් දැවැන්ත සහයෝගයක් ලබා දුන්නා ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා බලයට පත් කරන්න.ඒ නිසයි අපිට ප්‍රතිපාදන ඉල්ලන්න යුතුකමක් තිබෙන්නේ.2018 ඉඳන් කිසිදු ප්‍රතිපාදනයක් ලැබෙන්නේ නැතිව අපි මේ සභාවේ ඉන්නවා.මේ ආණ්ඩුව බිහි කරන්න ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරු කැප කිරීම් කලා.ඒකට කළගුණ සලකන්න මේ ආණ්ඩුවේ නායකයෝ කටයුතු කරයි කියලා විශ්වාස කරනවා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරු ජනතාව එක්ක ඉන්නවා.මෙවැනි තත්ත්වයක් එක්ක මේ රජය තුල අපි ඉන්නවාද නැද්ද කියන එක ඉහල පෙළේ නායකයෝ තීරණය කරයි.ආණ්ඩුවේ අඩුපාඩු තිබුණොත් අපි ඒ ගැන කතා කරනවා.ඒ වගේම පසුගිය සභාවන් තුල දී ඔබතුමාට වගේම ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ නියෝජනය කල

හිටපු ගරු සභාපති සුනිල් ජයවීර මැතිතුමාට අපි සහයෝගය දැක්වූවා.ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරු විදිහට මේ සභාවට අකුල් හෙලන්න අපි කැමති නෑ.ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ නියෝජනය ඔබතුමා වෙනුවෙනුත් අපි අවශ්‍ය අවස්ථාවල ඡන්දය පාවිච්චි කලා.එලෙස ප්‍රාදේශීය සභාවලටත් බලය පවත්වාගෙන යන්න උදව් කරන ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරුන්ට තමයි ආණ්ඩුව මේ විදිහට සලකන්නේ.ගරු සභාපතිතුමණි,අපි අද මේ යෝජනාව ඉදිරිපත් කරන්නේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරු මේ ආණ්ඩුව හදන්න ඇප කැප වී කටයුතු කලා,ඒකට කළගුණ සලකයි කියන විශ්වාසය තවමත් අතිගරු ජනාධිපතිතුමා,ගරු අග්‍රාමාත්‍යතුමා,මුදල් අමාත්‍යතුමා පිළිබඳව තිබෙන නිසයි.ඒ නිසා ඒ සම්බන්ධව ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ට සාධාරණයක් ඉටු කිරීමට ඉහල නායකත්වය කටයුතු කරයි කියලා මම විශ්වාස කරනවා.

- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩී.ජී.බී.එම්.චාමින්ද දසනායක මහතා පෙ.ව.11.30 ට පමණ ගරු සභාවෙන් බැහැරට ගියා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ජේ.පී.නිශාන්ත දේශප්‍රිය ජයලත් මහතා - (එ.ජ.නි.ස.)</u>**

එම යෝජනාව මා ස්ථිර කරනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඒ.ජී.ඩී.රංජිත් ප්‍රේමලාල් මහතා - (එ.ජ.නි.ස.)</u>**

පසුගිය ජනාධිපතිවරණයේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ හා ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ අපි සියලු දෙනා කටයුතු කළේ අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා බලයට පත් කරන්න.ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ හිටපු ගරු ජනාධිපති මෛත්‍රිපාල සිරිසේන මැතිතුමා සභාපතිවරයා විදියටත්,දයාසිරි ජයසේකර මැතිතුමා මහ ලේකම්වරයා විදියටත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සියලුම සංවිධායකවරු,ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු සියලු දෙනා එකතු වෙලා ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා අතිගරු ජනාධිපතිවරයා වශයෙන් පත් කලා.අපි සියලු දෙනා එකතු වෙලා ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා අතිගරු ජනාධිපතිවරයා වශයෙන් පත් කලේ.ඉන් පසුව අපි තුනෙන් දෙකක බලයක් සහිත ආණ්ඩුවක් හැදුවා.එහි දී ගිවිසුම් ගත වුණේ අපි සියලු දෙනාම දන්නවා ආණ්ඩුවේ හවුල්කාර පක්ෂ වලට ලැබෙන සියලු වරප්‍රසාද ලැබෙනවා.අපිට වරප්‍රසාද පිළිබඳව ගැටළුවක් නෙවෙයි.මොකද ආණ්ඩුවක් තුල කටයුතු කරන විට සහෝදර පක්ෂ විදියට එකට කටයුතු කරන විට දිගින් දිගටම ලැබෙන කෙණහෙලිකම්,අඩුලුහුඩුකම් බලාගෙන ඉන්න බැරිව තමයි මෙ යෝජනාව ගෙනාවේ. පඩුවස්නුවර ආසනය ගත්තාම ශ්‍රී ලංකා පොදුජන පෙරමුණට කොට්ඨාස 18 ක්,කොට්ඨාස 03 ක් එක්සත් ජාතික පක්ෂයට හා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට එක් කොට්ඨාසයක් තිබෙනවා.පක්ෂවලට ලැබුණු ඡන්ද ප්‍රතිශතය අනුව මන්ත්‍රීවරු සංඛ්‍යාවත් බෙදී ගිහින් තිබෙනවා.අපි සියලු දෙනාම නියෝජනය කරන්නේ මහජනතාවයි.එහි දී මේ මැතිවරණ ක්‍රමය අනුව හැමෝටම කොට්ඨාස දිනලා එන්න අවස්ථාවක් තිබුණේ නෑ.කොට්ඨාසවල වසමකට ලක්ෂ තිහකට සංවර්ධන යෝජනා ගද්දී,අපේ කොට්ඨාසයේ අරවින්ද ගරු මන්ත්‍රීතුමාත් මමත් පඩුවස්නුවර කොට්ඨාසයේ ආණ්ඩුව නියෝජනය කරන අපි දෙදෙනාගෙන්ම තමයි යෝජනා ගත්තේ.ඒ සම්බන්ධව ස්තූතිවන්ත වෙනවා.නමුත් අපි මේ ප්‍රාදේශීය සභාව නියෝජනය කරන ගරු මන්ත්‍රීවරු විදියට කොට්ඨාසයකට ලැබෙන ලක්ෂ 40ක මුදල අපේ ප්‍රාදේශීය සභාවට ලැබෙන විට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයටත් ලැබුණා නම් හොඳයි කියලා මම හිතනවා.මොකද අපි සියලු දෙනා එකතු වෙලා මේ ආණ්ඩුව ගන්න තීරණ වලට අපි පෙනී සිටිනවා.ඒ වගේම ප්‍රාදේශීය සභාවේ ගරු සභාපතිතුමා,ගරු උප සභාපතිතුමා නියෝජනය කරන පොදුජන පෙරමුණට එතුමන්ලා පත් කරන අවස්ථාවේ අපි සහයෝගය ලබා දුන්නා.පසුගිය කාලයේ ඉදිරිපත් කල හොඳ යෝජනා සියල්ලටම අපි සහයෝගය ලබා දුන්නා.

- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී අමිල නිශාන්ත අරවින්ද මහතා පෙ.ව.11.45 ට පමණ ගරු සභාවෙන් බැහැරට ගියා.

මේ කොට්ඨාස වලට ප්‍රතිපාදන ලබා දෙද්දී ඇයි ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරුන්ට ඒ වරප්‍රසාද ලැබෙන්නේ නැත්තේ.යහපාලන ආණ්ඩුව කාලේ අපි එක්සත් ජාතික පකෂයත් එක්ක එකතු වෙලා ආණ්ඩුව ගෙන ගියා.එහි දී ප්‍රතිපාදන කොට්ඨාසයක මන්ත්‍රීවරු දෙදෙනෙක් ඉන්නවා නම් ඒ දෙදෙනාටම සමානව ලැබුණා.මේ රුපියල් ලක්ෂ 40 න් ලක්ෂ 10 ක් වත් අපිට ලබා දෙන්න හැකියාවක් තිබුණේ නැද්ද?රජයෙන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට මාර්ග කිලෝමීටර් 30 ගනේ හදන්න ප්‍රතිපාදන දුන්නා.අපේ දයාසිරි ජයසේකර මැතිතුමන්ලාට ඒක ලැබුණෙත් නෑ.අපි දුන්න යෝජනාවලට ප්‍රතිපාදන ලැබෙන්නේත් නෑ.ඉදිරියේ දී මොන මොන තීන්දු ගනියිද අපි දන්නේ නෑ.ආණ්ඩුවේ සහෝදර පක්ෂයක් විදිහට අපි ඉන්නවා නම් අපි සියලු දෙනා ඒ දේවල් බලාපොරොත්තු වීම වරදක් නෙවෙයි.ඒ වගේම ගම්වල සිදු කරන සංවර්ධන කටයුතු,ජනතාවට සුභ සාධනය සැලසීමේ කටයුතු වලට අපිව සම්බන්ධ කර ගන්නේ නෑ.පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව නියෝජනය කරන නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරු සියලු දෙනාම

ඉල්ලන්නේ.මේ පිළිබඳව අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාට,ගරු අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමාට,මුදල් අමාත්‍ය බැසිල් රාජපක්ෂ මැතිතුමාට මේ අපේ මතය ලැබීමට සලස්වන්න.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ජේ.පී.නිශාන්ත දේශප්‍රිය ජයලත් මහතා - (එ.ජ.නි.ස.)</u>**

ගරු සභාපතිතුමණි,මේ ලක්ෂ හතළිහේ ප්‍රශ්නය සම්බන්ධව ජනතාවත් අපෙන් අහනවා.ජනතාව හිතන්නේ ඒ මන්ත්‍රීවරු වැඩ කරනවා ඇති,අපි වැඩ කරන්නේ නෑ කියලා.මේක අපි රජයට ප්‍රකාශ කරන දුක්ගැනවිල්ලක් වෙන්නත් පුළුවන්.සෞභාග්‍යයේ දැක්ම වෙනුවෙන් අපි ලොකු කැපකිරීමක් කලා.ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ගරු සභාපතිතුමා,පක්ෂයේ මහ ලේකම්තුමා,එතුමන්ලා සාකච්ඡා කරලා ගිවිසුම්ගත වූ නිසා තමයි එතුමන්ලාට ජයග්‍රහණය කරා යන්න උදව් කළේ.අතිගරු ජනාධිපතිතුමාටත්,ගරු අග්‍රාමාත්‍යතුමාටත් අපේ මේ යෝජනාව දැක බලා ගන්න ඉදිරිපත් කරන්න.මහා මාර්ග කැබිනට් අමාත්‍යතුමා.එතුමා කුරුණෑගල දිස්ත්‍රික්කයේ.එතුමාවත් කිසිම සහයෝගයක් ලබා දෙන්නේ නෑ.එතුමා මේ සම්බන්ධළු කිසිම උනන්දුවක් දක්වන්නේ නෑ.එක් අවස්ථාවක එතුමාගේ යෝජනාවක් ආවා කිලෝමීටර් දෙක ගණනේ ලබා දෙනවා කියලා. කිලෝමීටර් දෙක ගණනේ තියා කිලෝමීටරයක්වත් දුන්නේ නෑ.ආණ්ඩුවට බලපෑමක්,ඉල්ලීමක් මේ කරන්නේ.ගම සමඟ පිළිසඳර වැඩසටහන පසුගිය වර්ෂයේ පැවැත්වුණා.ඒ වගේ වැඩසටහන් එනකොට ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නියෝජනය කරන අපිට එවැනි අවස්ථා සඳහාවත් ආරාධනාවක් ලැබෙන්නේ නෑ.ඡන්දයෙන් පත් වූ මන්ත්‍රීවරුන්ගේ යෝජනා විතරයි ගන්නේ.අපි සියලු දෙනාම සෞභාග්‍යයේ වැඩසටහන වෙනුවෙන් වැඩ කළා.ගරු සභාපතිතුමණි,අපි විශාල කැපකිරීමක් කලා මේ රාජපක්ෂ කඳවුර බලයට ගේන්න.දැන් මේකේ තීන්දුව අරගෙන තිබෙන විදියට කොට්ඨාස දිනපු සියලු දෙනාට මේ මුදල ලැබෙනවා.අනෙකුත් සභා වලිනුත් මම ඉල්ලීමක් කරනවා මේ යෝජනාව සභාවට දාලා රජයෙන් ඉල්ලීමක් කරන්න කියලා.මේක සියලු ප්‍රාදේශීය සභාවලටද,අපිට විතරද නතර කරලා තිබෙන්නේ කියලා දන්නේ නෑ.කොතනද මේක නතර කරලා තිබෙන්නේ කියලා සොයා බැලුවොත් ලොකු දෙයක්.ඒ වගේම සම්බන්ධීකරණ කමිටුවට අපිට තිබෙන කාරණා ඉදිරිපත් කරන්න අවස්ථාව සලසා දෙන්නේ නෑ.පඩුවස්නුවර ආසනයේ සංවිධායකතුමා ඒකට අපිට ආරාධනා කරන්නේ නෑ.හැබැයි මේ ආණ්ඩව හදන්න නිදහස් පක්ෂය ලොකු කැපකිරීමක් කලා.රාජපක්ෂ කඳවුර පලවා හරින්න කටයුතු කල අයට මේක ලැබෙනවා.රාජපක්ෂවරු බලයට ගේන්න වැඩ කල අපිට මොකවත් නෑ. මේ සම්බන්ධව අතිගරු ජනාධිපතිතුමා,ගරු අගමැතිතුමා,ඒ වගේම මුදල් අමාත්‍ය බැසිල් රාජපක්ෂ මැතිතුමා හා මහාමාර්ග අමාත්‍යතුමා මේ සම්බන්ධව දැනුවත් කරන්න.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ඩී.මනෝ කුමාර එදිරිසිංහ මහතා - (එ.ජා.ප.)</u>**

ආණ්ඩුව එපා නම් ඉහළ තැන් වලට කතා කරලා ඉවත් වෙන්න.

***<u>ගරු උප සභාපති රංජිත් ආනන්ද බණ්ඩාර මහතා</u>***

ගරු සභාපතිතුමණි,ඇත්තටම අපේ දේශපාලනය ඇතුලේ පුංචි පුංචි අර්බුද ඇති වී තිබෙනවා. වත්මන් රජය මඟින් කොට්ඨාසයකට අදාල ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ට ලබා දෙන රුපියල් ලක්ෂ 40 ක මුදල සභාව නියෝජනය කරන නිදහස් පක්ෂයේ සියලු මන්ත්‍රීවරුන්ට ද ලබා දීමට කටයුතු කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව සම්බන්ධව ඉහල දේශපාලන අධිකාරිය දැනුවත් කරන ලෙස ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවට ඔබතුමන්ලාව කැඳවන්නේ නෑ කියන කාරණය ඔබතුමන්ලා මතු කලා.ඒකට ගුණපාල රත්නසේකර මහතා සම්බන්ධ කර ගන්න එපා.මොකද ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවට කැඳවන්නේ ප්‍රදේශීය ලේකම්තුමන් දෙපලයි.ගුණපාල රත්නසේකර මහතා සභාපතිවරයා ලෙස ඒකට සම්බන්ධ වෙනවා.එතුමන්ව ප්‍රදේශීය ලේකම්තුමන් දෙපල ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව පිළිබඳ දැනුවත් කරනවා ඇති.ඒ වගේම පසුගිය කාලයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට ලබා දුන්නා ලක්ෂ 100 ක්.අද මේ වන විට ගරු ජනාධිපතිතුමාත්,අග්‍රාමාත්‍යතුමාත් සියලු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට ලක්ෂ 150 ක මුදලක් මේ වන විට ලබා දෙනවා.මේ තීන්දු තීරණ රජයක් විදියට ගන්න කොට පක්ෂ දිහා බලලා තීන්දු ගන්න බෑ.පාර්ලිමේන්තු මන්ත්‍රීවරු නම් සියලු දෙනා පාර්ලිමේන්තු මන්ත්‍රීවරු.ඒ ප්‍රතිපාදන ලබා දෙන්නේ සියලු මන්ත්‍රීවරුන්ට.ඒ නිසා ගරු මන්ත්‍රීතුමා කීවා වගේ ලක්ෂ 40 ක මුදල පිළිබඳව විජය උදාගම කොට්ඨාසයේ,පලුගස්වැව කොට්ඨාසයේ හා ගොමුගොමුව කොට්ඨාසයේ අපේ මන්ත්‍රීවරුත් බොහෝම කනස්සල්ලෙන් ඉන්නේ. ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවල සභාපතිවරුන්ට හා උප සභාපතිවරුන්ට ලක්ෂ 1000 ගානේ සියලු දෙනාටම ලබා දුන්නා.ඒ මුදල ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන්ටත් ලබා දිය යුතු නිසා ඒකට චක්‍රලේඛයක් ගැහුවා සියලු ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවල සභාපතිවරුන්ට හා උප සභාපතිවරුන්ට මේ මුදල ලබා දෙනවා කියලා.ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සියලුම පාර්ලිමේන්තු මන්ත්‍රීවරු ඒ වන විට ගරු ජනාධිපතිතුමා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවල සභාපති හා උප සභාපති තනතුරු වලට පත් කරලා තිබුණේ.ඒ පත් කිරීම තුල ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සියලුම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට ඒ මුදල ලැබුණා.පසුගිය වර්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුට කිලෝ මීටර් 25 ක් ලබා

දුන්නා.ඒ ලබා දීම තුල මම දන්නවා දයාසිරි ජයසේකර මැතිතුමාටත් ඒ කිලෝ මීටර් 25 ලබා දුන්නා.ඒ වගේම මන්ත්‍රීවරුන්ට ලබා දුන් ඒ ලක්ෂ 40 කොට්ඨාස දිනපු ගරු මන්ත්‍රීවරුන්ට ලබා දෙන්න කියලා චක්‍රලේඛයක් නිකුත් කලා.පක්ෂය මොකක්ද බැලුවේ නෑ.කොට්ඨාස දිනන ලද සියලු මන්ත්‍රීවරුන්ට ඒ ලක්ෂ 40 ලබා දෙන්න කටයුතු කර තිබෙනවා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ආණ්ඩුවේ හවුල්කාර පක්ෂයක් විදිහට ඔබතුමන්ලාට යම් කලකිරීමක් ඇති ප්‍රතිපාදන අඩු වීම සම්බන්ධව.ප්‍රතිපාදන ලබා දෙන්නේ යම් නිර්ණායක මත.ඒක තමයි කොට්ඨාස දිනන ලද සියලු මන්ත්‍රීවරුන්ට ඒ ලක්ෂ 40 ලබා දෙන්න කටයුතු කර තිබෙන්නේ.ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කල කාරණය ඉදිරියට යොමු කරන්න කියන කාරණය ප්‍රකාශ කරනවා.

- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී අයි.ඒ.බංඩාරමැණිකා මහත්මිය ප.ව.12.09 ට පමණ ගරු සභාවෙන් බැහැරට ගියා.

<u>**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ටී.ආර්.එම්.අපර්ණ නිලුපුල් සේනාරත්න මහතා - (එ.ජ.නි.ස.)**</u>

ගරු මන්ත්‍රීතුමා කීවා දයාසිරි ජයසේකර මැතිතුමාට කිලෝ මීටර් 25 ලබා දුන්නා කියලා.එතුමා පසුගිය වකවානුවේ ප්‍රසිද්ධ මාධ්‍යයේ ප්‍රකාශ කලා එක කිලෝ මීටරයක්වත් ලැබුණේ නෑ කියලා.ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ඉන්න අපේ හිටපු ගරු ජනාධිපතිතුමාටවත්,මහ ලේකම්තුමාටවත්,වෙන කාටවත් කිලෝ මීටරයක් තියා අඟලක් වත් හම්බුණේ නෑ.

<u>**ගරු උප සභාපති රංජිත් ආනන්ද බණ්ඩාර මහතා**</u>

ගරු මන්ත්‍රීතුමා,ඒක බොරුවක් නෙවෙයි.ගරු ජනාධිපතිතුමාගේ පළමු පදවි ප්‍රාප්තියට සමගාමීව තමයි ඒ කිලෝ මීටර් 25 දුන්නේ.ඒකේ ඔබතුමාලාගේ ගරු නායකතුමා ගිහින් තමයි පාරේ වැඩ ආරම්භ කලේ.

<u>**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.කේ.නිමල් ප්‍රේමසිරි දයානන්ද මහතා - (එ.ජා.ප.)**</u>

ගරු සභාපතිතුමණි,,සභාවේ එක් මන්ත්‍රීවරයෙකුට එක් කාරණයක් පිළිබඳව කතා කිරීමට එක අවස්ථාවක් ලබා දෙන්න.නිතර නිතර ඒ සම්බන්ධව කතා කරන්න අවස්ථාව ලබා දෙන්න එපා.ඒකෙන් කාලය අපතේ යනවා.

<u>**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩී.එම්.සුනිල් හේමචන්ද්‍ර දිසානායක මහතා - (එ.ජා.ප.)**</u>

ගරු සභාපතිතුමණි,ඔබතුමා පක්ෂයේ කණ්ඩායම් නායකයින්ට දෙන කතාවක් කීවානේ.ඒ නිසා මම අවස්ථාව ඔබතුමාගෙන් ගන්නවා.මේ ප්‍රතිපාදන පිළිබඳව ගරු මන්ත්‍රී අපර්ණ නිලුපුල් මහතා යෝජනාවක් ගෙනාවා.ඒ වගේම ගරු උප සභාපතිතුමා ඊට අවශ්‍ය පිළිතුරු ලබා දුන්නා.යම් කාරණයකට පිළිතුරු ලබා දීමේ දී ඒ කරුණු පදනම් විරහිත නම් එය නිවැරදි කිරීමට අවස්ථාව ලබා දිය යුතුයි.එවැනි අවස්ථාවල අදාල කාරණය නිවැරදි කිරීමට අවස්ථාව ලබා දෙන ලෙස මම ඉල්ලා සිටිනවා.

<u>**ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා**</u>

ගරු මන්ත්‍රීවරුණි,එක් කාරණයක් සම්බන්ධව එක් මන්ත්‍රීවරයෙක් එක් වතාවක් පමණක් අදහස් ඉදිරිපත් කිරීමට කටයුතු කරන්න.

<u>**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ආර්.පී.සරත්චන්ද්‍ර ජයතිලක මහතා - (ශ්‍රී.ල.පො.ජ.පෙ.)**</u>

ගරු සභාපතිතුමණි,තමන් කැප කිරීම් කරලා ඒකේ ප්‍රතිලාභ මහජනතාවට නොලැබෙනවා නම් ඒකේ වේදනාව මහජන නියෝජිතයෝ හැටියට අපි දන්නවා.2018 වර්ෂයේ ප්‍රාදේශීය සභා මැතිවරණයේ අපි මේ ප්‍රාදේශීය සභාවේ කොට්ඨාස 18 ක් ජයග්‍රහණය කලා.එපමණක් නොවෙයි එවකට සිටි ප්‍රබල විපක්ෂය වන එක්සත් ජාතික පක්ෂයට වඩා වැඩි ඡන්ද දස දහසකට ආසන්න ප්‍රමාණයකින් ජයග්‍රහණය කරලා කොට්ඨාස වලට මන්ත්‍රීවරු පත් කලා.මේ අපේ ආණ්ඩුව නම්,අපි හදා ගත්ත නායකයා නම් මේ රටේ අර්බුදකාරී තත්ත්වයක් තිබෙද්දී ඒක උග්‍ර තත්ත්වයට එනකම් සිටිනවා නම් මම හිතන්නේ නෑ ඒ අපේ ආණ්ඩුවේ සාමාජිකයෝ කියලා.

- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනී ඒ.එන්.පද්මා වීරසිංහ මහත්මිය ප.ව.12.20 ට පමණ ගරු සභාවෙන් බැහැරට ගියා.
- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩී.එම්.සුනිල් හේමචන්ද්‍ර දිසානායක මහතා ප.ව. 12.20 ට පමණ ගරු සභාවෙන් බැහැරට ගියා.
- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එච්.එම්.ජයන්ත හේරත් මහතා ප.ව. 12.20 ට පමණ ගරු සභාවෙන් බැහැරට ගියා.

- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ආර්.ඩබ්ලිව්.බී.එම්.ඉන්දික ප්‍රදීප් රාජගුරු මහතා ප.ව. 12.20 ට පමණ ගරු සභාවෙන් බැහැරට ගියා.
- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ඒ.චමින්ද ප්‍රදී මල්ලවආරච්චි මහතා ප.ව.12.20 ට පමණ ගරු සභාවෙන් බැහැරට ගියා.
- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ජී.විරාජ් මලින්ද ඩයස් මහතා ප.ව.12.20 ට පමණ ගරු සභාවෙන් බැහැරට ගියා.
- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එල් .ඒ.විරාජ් මධුසංක විජේසිංහ මහතා ප.ව.12.20 ට පමණ ගරු සභාවෙන් බැහැරට ගියා.
- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.කේ.නිමල් ප්‍රේමසිරි දයානන්ද මහතා ප.ව.12.20 ට පමණ ගරු සභාවෙන් බැහැරට ගියා.
- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ජේ.පී.අමරසිංහ මහතා ප.ව.12.20 ට පමණ ගරු සභාවෙන් බැහැරට ගියා.
- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එච්.එම්.ප්‍රදීප් සුජීව හේරත් මහතා ප.ව.12.20 ට පමණ ගරු සභාවෙන් බැහැරට ගියා.

රජයකට බැරි උන අවස්ථාවක තමයි අපේ කැප කිරීම්,වගකීම් ඉටු කරන්නේ.ඒ නිසා මේ ආණ්ඩුවත් කොපමණ අභියෝග අපහසුතා තිබුණත් ඒ සියලුලට මුහුණ දෙන ගමන්ම රටේ සංවර්ධනය කිසිසේත්ම අඩපණ කලේ නෑ.කොට්ඨාස ජයග්‍රහණය කල සියලු ගරු මන්ත්‍රීවරු,එක්සත් ජනතා නිදහස් සන්ධානයෙන් හා එක්සත් ජාතික පක්ෂයෙන් කොට්ඨාස ජයග්‍රණය කල ගරු මන්ත්‍රීවරු නිහඬව ඉන්නේ ඒ අයට සාධාරණය ඉටු වුණ නිසයි.මේ තීන්දු තීරණ ගද්දී මම විශ්වාස කරන විදිහට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මහ ලේකම් දයාසිරි ජයසේකර මැතිතුමන්ලා ඇතුළු පිරිස මේ කණ්ඩායම් රැස්වීම් වල දී, නායකතුමන්ලා එකතු වී කරන රැස්වීම් වල දී එකඟ වෙනවා.පාර්ලිමේන්තුවේ සම්මත කරගෙන තමයි මේ ප්‍රතිපාදන ගම් වලට ගලාගෙන එන්නේ.කොට්ඨාසය ඉලක්ක කරලා තමයි මන්ත්‍රීවරුන්ට මේ මුදල ලබා දුන්නේ. කොට්ඨාස

තුල තිබෙන අවශ්‍යතා සොයා බලලා වැඩ කටයතු කිරීම මහජන නියෝජිතයෝ හැටියට අපි සියලු දෙනාගේම යුතුකමක් හා වගකීමක්.ඒ වගේම රැකියා ලක්ෂයේ වැඩ පිළිවෙල ක්‍රියාත්මක වෙද්දී පාර්ලිමේන්තුව නියෝජනය කරන සියලු ගරු මන්ත්‍රීවරුන්ට රැකියා 600 ගණනේ ලබා දුන්නා.අපේ ආසනය නියෝජනය කරන ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක ගුණපාල රත්නසේකර මැතිතුමාට රැකියා 600 ක් ලැබුණා.එතුමා ඒවා විශාල ප්‍රමාණයක් අපේ කොට්ඨාසයේ මන්ත්‍රීවරුන්ට බෙදලා දුන්නා. දිස්ත්‍රික් නායකතුමා වශයෙන් දයාසිරි ජයසේකර මැතිතුමාට හා ශාන්ත බණ්ඩාර මැතිතුමාට මේ රැකියා ලක්ෂය ලැබුණා කියලා මම විශ්වාස කරනවා.අදටත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ එතුමන්ලා පත්වීම් ලබා දුන් රාජකාරී කටයුතු සිදු කරන බහු කාර්යය නිලධාරීන් ඉන්නවා.ලක්ෂයක් අරමුණු කර ගත්තත් පළමු අධියර හැටියට මේකේ 35,000 ක් වගේ ප්‍රමාණයක් තමයි ලබා දුන්නේ.දයාසිරි ජයසේකර මැතිතුමාගේ පමණක් නොවෙයි, ගුණපාල රත්නසේකර මැතිතුමාගේ කිහිප දෙනෙක්ට තවම රැකියා අවස්ථාව ලැබී නෑ.ඒ වගේ අඩුපාඩු තිබෙනවා.ඒ වගේම ප්‍රබල අමාත්‍යාධූරයක් දරණ දයාසිරි ජයසේකර මැතිතුමාට කිලෝ මීටර් අගලක් වත් ලැබුණේ නෑ කීවා.අපි දන්න විදියට,මේ දේ වැරදි නම් නිවැරදි කරන්න පුළුවන්,එදා මහාමාර්ග අමාත්‍යතුමාගේ දක්ෂිත ලේකම්තුමා ඒ උත්සවයට සහභාගී වුනා.දයාසිරි ජයසේකර මැතිතුමා සහභාගී වුනා.ඒ අවස්ථාවේ අරවින්ද මන්ත්‍රීතුමාගේ කොට්ඨාසයේ ගුණපාල රත්නසේකර මැතිතුමාට ලැබුණු කිලෝ මීටර් තිස් පහෙන් අපි ගරු අග්‍රාමාත්‍යතුමාගේ පදවි ප්‍රාප්තියට සමගාමීව ඒ පාරේ වැඩ පටන් ගත්තා.හැබැයි දයාසිරි ජයසේකර මැතිතුමා තමයි ගිහින් පුබ්බෝව දෙමලදොර මාර්ගයේ වැඩ පටන් ගත්තේ.ඒක ඔබතුමාලාගේ යෝජනාවක් නෙවෙයි නම් ඒක ඔබතුමන්ලාට ප්‍රකාශයට පත් කරන්න පුළුවන්.අනෙක් කාරණය තමයි සභාවේ හෝ අමාත්‍යාංශයක හෝ කිසි කෙනෙක් කිසිම දෙයක් ළඟට ගෙනත් දෙන්නේ නෑ.අපිත් ජොන්ස්ටන් ප්‍රනාන්දු මැතිතුමා හොයාගෙන ගිහින් එතුමාට අපේ දුක්ගැනවිල්ල කියලා තමයි අපිත් යම්කිසි මාර්ගයක් අනුමත කර ගන්නේ.එතුමන්ලාටත් පුළුවන් ආණ්ඩු පක්ෂය නියෝජනය කරන මන්ත්‍රීවරු හැටියට මහාමාර්ග අමාත්‍යතුමා මුණ ගැහිලා තමන්ගේ යෝජනා ඉදිරිපත් කරන්න.එතකොට සියයට සියයක් නැති උනත් යම්කිසි ප්‍රමාණයක් හරි ලබා දෙයි.ඒ වගේම ආණ්ඩුව ලබා දුන් ප්‍රතිපාදන වලට

අපේ ගෞරවය හා ස්තුතිය පුද කරනවා.කොන්ත්‍රාත්කරුවන් සොයා ගැනීමේ අපහසුතා,කොවිඩ් වසංගත තත්ත්වයන් හා අමුද්‍රව්‍ය හිඟ වීම වැනි කාරණා මත විශාල වශයෙන් ව්‍යාපෘති ඇණ හිටලා තිබෙන්නේ.ඒක අපි තේරුම් ගන්න ඕන.ඔබතුමන්ලා ආණ්ඩුවම විවේචනය කරනවාට වඩා,ආණ්ඩු පක්ෂයේ හවුල්කාර පක්ෂයක් හැටියට ආණ්ඩුව ආරක්ෂා කරන වැඩ පිළිවෙලක් තුල ඉන්නවා නම් මීට වඩා ප්‍රශ්න නිරාකරණය කර ගන්න පුළුවන් කියන එක තමයි මගේ අදහස.

- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ආර්.පී.සරත්චන්ද්‍ර ජයතිලක මහතා ප.ව.12.26 ට පමණ ගරු සභාවෙන් බැහැරට ගියා.

<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>

කොට්ඨාස ජයග්‍රහණය කල සියලු මන්ත්‍රීවරුන්ට පක්ෂ භේදයකින් තොරව ගරු මුදල් අමාත්‍යතුමා විසින් මේ ප්‍රතිපාදන ලබා දී තිබෙනවා.ඒ වගේම මා ගරු සභාපතිධූරයට පත් වුනාට පසුව පක්ෂ භේදයකින් තොරව සියලු ගරු මන්ත්‍රීවරුන්ට,සියලු කොට්ඨාස වලට ප්‍රතිලාභ සමානව දුන්නා.සියලු දෙනාටම කොට්ඨාසවල වැඩ කිරීමට මම ශක්තිය ලබා දී තිබෙනවා.
වත්මන් රජය මඟින් කොට්ඨාසයකට අදාල ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ට ලබා දෙන රුපියල් ලක්ෂ 40 ක මුදල සභාව නියෝජනය කරන නිදහස් පක්ෂයේ සියලු මන්ත්‍රීවරුන්ට ද ලබා දීමට කටයුතු කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සහා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව වත්මන් රජය මඟින් කොට්ඨාසයකට අදාල ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ට ලබා දෙන රුපියල් ලක්ෂ 40 ක මුදල සභාව නියෝජනය කරන නිදහස් පක්ෂයේ සියලු මන්ත්‍රීවරුන්ට ද ලබා දීමට කටයුතු කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සහා සම්මත විය.**

## II. පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ 2021.12.31 දිනට ඉදිරිපත් කර ඇති ගිණුමේ ශේෂ පත්‍රය ගැසට් පත්‍රයේ පල කිරීම - (විශේෂ යෝජනා)

<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>

පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ 2021.12.31 දිනට ඉදිරිපත් කර ඇති ගිණුමේ ශේෂ පත්‍රය භාෂාත්‍රයෙන් ගැසට් පත්‍රයේ පල කිරීම සුදුසු බව මා යෝජනා කරනවා.

<u>පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව</u>

<u>2021 දෙසැම්බර් මස 31 දිනට මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය</u>

| | සටහන් | 2021.12.31 | 2020.12.31 |
|---|---|---|---|
| <u>වත්කම්</u> | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපල, පිරියත සහ උපකරණ | 06 | 484142621.21 | 300842655.23 |
| **ජංගම වත්කම්** | | | |
| තොග | 07 | 5873492.97 | 4686713.26 |
| සේවක ණය හා අත්තිකාරම් | 08 | 8028818.84 | 10362951.84 |
| ලැබිය යුතු දෑ | 09 | 94996080.67 | 91587328.89 |
| ආයෝජන | 10 | 12615414.77 | 10874412.07 |

| | | | |
|---|---|---|---|
| මුදල් හා මුදල් සමාන දෑ | 11 | 24100357.24 | 23186001.73 |
| | | 145614164.49 | 140697407.79 |
| **මුළු වත්කම්** | | 629756785.70 | 441540063.02 |
| <u>**වගකීම්**</u> | | | |
| ජංගම නොවන වගකීම් | 12 | 2957305.55 | 6009956.74 |
| ජංගම වගකීම් | 13 | 50621634.65 | 37857665.78 |
| හිමිකම | 14 | 576177845.50 | 397672440.50 |
| **මුළු හිමිකම් සහ වගකීම්** | | 629756785.70 | 441540063.02 |

<u>**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.එම්.නන්දසිරි මහතා - (එ.ජ.නි.ස.)**</u>

එම යෝජනාව මා ස්ථිර කරනවා.

<u>**ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා**</u>

පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ 2021.12.31 දිනට ඉදිරිපත් කර ඇති ගිණුමේ ශේෂ පත්‍රය භාෂාත්‍රයෙන් ගැසට් පත්‍රයේ පල කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සහා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ 2021.12.31 දිනට ඉදිරිපත් කර ඇති ගිණුමේ ශේෂ පත්‍රය භාෂාත්‍රයෙන් ගැසට් පත්‍රයේ පල කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාව ඒකමතිකව සහා සම්මත කරන ලදී.**

## III. ඓතිහාසික නුවර දළදා පෙරහැරේ දන්ත ධාතූන් වහන්සේ වැඩම කල නැදුන්ගමුවේ ඇත් රජිඳා වෙනුවෙන් ශෝකය ප්‍රකාශ කිරීම හා ජාත්‍යන්තර කාන්තා දිනය වෙනුවෙන් අදහස් දැක්වීම - (විශේෂ යෝජනා)

<u>**ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා**</u>

ඓතිහාසික නුවර දළදා පෙරහැරේ දන්ත ධාතූන් වහන්සේ වැඩම කල නැදුන්ගමුවේ ඇත් රජිඳා වෙනුවෙන් ශෝකය ප්‍රකාශ කිරීම හා ජාත්‍යන්තර කාන්තා දිනය වෙනුවෙන් අදහස් දැක්වීම සම්බන්ධව විශේෂ යෝජනාවක් ගරු මන්ත්‍රීනී ඩී. නිමාලි දිල්හානි මෙනවිය ඉදිරිපත් කර තිබෙනවා.ඒ සඳහා එතුමියට අවස්ථාව ලබා දෙනවා.

<u>**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩී. නිමාලි දිල්හානි මෙනවිය - (ශ්‍රී.ල.පො.ජ.පෙ.)**</u>

ඓතිහාසික නුවර දළදා පෙරහැරේ දන්ත ධාතූන් වහන්සේ වැඩම කල නැදුන්ගමුවේ ඇත් රජිඳා වෙනුවෙන් ශෝකය ප්‍රකාශ කිරීම හා ජාත්‍යන්තර කාන්තා දිනය වෙනුවෙන් අදහස් දැක්වීම සුදුසු බව මා යෝජනා කරනවා.1953 ඉන්දියාවේ උපත ලබලා නැදුන්ගමුවේ රාජා හස්ති රාජයා හර්ෂවිජය වෙද පවුලට සහ සම්බන්ධ වෙලා අවුරුදු 69 ක් ආයුෂ වළඳලා ඊයේ දවසේ අපේ රටට සිටි උතුම් ජාතික වස්තුවක් අපට අහිමි උනා.ඊයේ දිනයේ රටේම බොහෝම ආන්දෝලනාත්මක ප්‍රවෘත්තියක් උනා මේක.උතුම් ධාතූන් වහන්සේ තමන්ගේ හිස මත වඩම්මවන්න තරම් අපේ හස්ති රාජයා බොහෝම පින්කාර උනා.පසුගිය ඇසල පෙරහැරේ ඔබතුමන්ලා දකින්න ඇති කරඩුව වඩම්මවන අවස්ථාවේ හස්තිරාජයාට යන්න එළලා තිබුණා පාවඩයක්.ඒ පාවඩය ඇකිළිලා තිබුණා.හස්ති රාජයා බොහෝම ගෞරවයෙන් තමන්ගේ හොඬවැලෙන් ඒ පාවඩය නැවත සකස් කරලා තමයි පාවඩය උඩ ගමන් කලේ.ත්‍යාගයක් හැටියට තමයි ලංකාවට මේ හස්ති රාජයා ලැබුණේ.ඊයේ දිනයේ මුද්‍රිත මාධ්‍යය,සමාජ මාධ්‍යය ඇතුලු බොහෝ දේවල්වල බොහෝ ශෝක ප්‍රකාශ පල උනා.රටේ නායකතුමාගේ ඉඳන් ගම් මට්ටමේ ඉන්න සාමාන්‍ය මනුෂ්‍යයා දක්වා බොහෝ ශෝක උනා,දුක් උනා.අවුරුදු 13 ක් දන්ත ධාතූන් වහන්සේ තමන්ගේ හිස මත වඩම්මවන්න වාසනාවන්ත උනා.කළු මාමා ඇතුළු හර්ෂවිජය වෙද පවුල හස්ති රාජයා වෙනුවෙන් රැකවරණය,ආරක්ෂාව ඇතුළු සියලු දේ ලබා දෙන්න කටයුතු කරලා තිබුණා.

- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ටී.එම්.ප්‍රදීප් සමන් කුමාරසිරි තෙන්නකෝන් මහතා ප.ව.12.35 ට පමණ ගරු සභාවෙන් බැහැරට ගියා.
- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එන්.ජී.සුනිල් බණ්ඩාර හපුගම්මන මහතා ප.ව.12.35 ට පමණ ගරු සභාවෙන් බැහැරට ගියා.

ලංකාවට ආව දවසේ ඉඳන් මේ වසර 69 තුල මේ හස්ති රාජයා වාහනයක ගමන් කරලා නෑ.හැම පෙරහැරකටම ගමන් කරලා තිබෙන්නේ පයින්.බොහෝම සද්ධන්ත වංශවත් කුලයක ඇත් රජෙක් තමයි අපිට නැති උනේ.මගේ කොට්ඨාසයේ ජනතාවගේත්,ආසනයේ සියලුම පක්ෂ විපක්ෂ ඉහල පෙළේ දේශපාලන නායකයින්ගේ සිට බිම් මට්ටමේ ඉන්න අපි මහජන නියෝජිතයින් දක්වා සහ පඩුවස්නුවර ආසනයේ ගරු සභාපතිතුමා ප්‍රධාන සියලුම දේශපාලන නායකයින්ගේ සහ ජනතාවගේ සාතිශය සංවේගය,ඒ වගේම අජරාමර නිවන් සුවය ඒ ඇත් රජිඳා වෙනුවෙන් මා මේ අවස්ථාවේ පිරිනමනවා.ඊයේ දිනයේ ජාතික වස්තුවක් හැටියට මේ ඇත් රාජයාගේ දේහය සංරක්ෂණය කරන්න අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගෙන් උපදෙස් ලැබුණා.ඒ අනුව දළදා මාලිගාවේ ඉදිරියේ දී තැන්පත් කරාවි.ඇසල පෙරහැරට ආලෝකයක් වූ වසර 13ක් තමන්ගේ හිස මත කරඬුව අරන් ගිය ඇත් රාජයාගේ අඩුව අපිට ගොඩක් දැනෙනවා.ඊටත් වඩා හර්ෂවිජය වෙද පවුලට වගේම ඇත්ගොව්වෝ හතර දෙනෙක්ගේ රැකවරණය ඔහුට තිබිලා තිබෙනවා.ඊයේ දිනයේ පුංචි දරුවාගේ පටන් වැඩිහිටියන් දක්වා
ගිහින් මේ ඇත් රජාට අවසන් ගෞරවය දැක්වූවා.දෙව්ලොව දෙවි කෙනෙක් වෙන්න තරම් මේ ඇත් රජිඳා භාග්‍යවන්තයි.මේ ඇත් රජිඳාට දෙව්ලොව හර්ෂවිජය වරම් ලැබේවා කියා ප්‍රාර්ථනා කරනවා.
මගේ යෝජනාවේ දෙවන කාරණය මම මෙලෙස ඉදිරිපත් කරනවා.
නැතිදාක ගැහැණියකගේ සවියක් - දැනේවි අපමණ අඩුවක්
නොගැයුවත් ගුණ ගැයුම් වරුවක් - රකිනු ඇය හැම දින පණ මෙන්
අද ජාත්‍යන්තර කාන්තා දිනය දවසේ මවක්,බිරිඳක්,සොයුරියක්,මිතුරියක්,මිත්තණියක් ලෙස සමාජයේ සෑම වගකීමක්ම ඉටු කරලා දරුවෝ වෙනුවෙන්,සමාජය වෙනුවෙන්,පවුල වෙනුවෙන්,රටක් වෙනුවෙන් දහදිය හෙලන්නට ,තමන්ගේ ලේ කිරි කරලා දරුවන්ට පොවන්නට ඒ තරම් උතුම් චරිතයක් වේ නම් මේ ලෝකයේ ඒ තමයි ගැහැණිය,කාන්තාව.අද ජාත්‍යන්තර කාන්තා දිනය සමරන මොහොතේ මම සතුටු වෙනවා.ඔබතුමා සභාවේ ඉදිරිපත් වෙලා අපේ වෙනසකට මහක් වැඩසටහන තුලින් සමස්ත රටේම දේශපාලනයේ යෙදෙන කාන්තාවන් සවිබල ගැන්වීමේ කාරණාවේ දී එම වැඩමුළුව සඳහා කාන්තාවන් සිය දෙනෙකුට අවස්ථාව ලබා දී තිබෙන බව ඔබතුමා සඳහන් කලා.අපේ සභාව නියෝජනය කරමින් ගරු මන්ත්‍රීනී සද්නා දිල්හානි මහත්මියට මේ සඳහා සම්බන්ධ වීමට භාග්‍යය ලැබී තිබෙනවා.ගරු සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රී මණ්ඩලයේ සුභ පැතුම් ඔබතුමියට ඉදිරිපත් කරනවා.කාන්තා දිනය දවසේ ඒ පුවත අසන්නට ලැබීමත් භාග්‍යයක්.විටක සිංහ ධේනුවකගේ රෞද්‍ර කමත්,විටක මුව ධේනුවකගේ අහිංසක කමත්, මේ සියල්ල පෙරදැරි කරගෙන ලෝකයටම ආදර්ශ ලබා දුන් කාන්තාවන් මේ ලෝකයේ ඉන්නවා.අපේ රජ කාලයේ විහාරමහා දේවිය,අනුලා දේවිය මේ වගේ බොහෝ වීර කාන්තාවෝ මේ රටේ බිහි වුනා.මෑත කාලයේ බිහි වූ වීරවරියක් තමයි ලෝකයේ ප්‍රථම අග්‍රාමාත්‍යවරිය,සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණිය.ඒ නිසා මේ කාන්තාවන්ට දිනයක් වෙන් කිරීම,ඒ සඳහා ඔවුන්ට ශක්තිය ලබා දීම සම්බන්ධව අපි සතුටු විය යුතුයි.ගැහැණිය කියන ඒ උතුම් මවට,බිරිඳට,සොයුරියට,මිතුරියට, මිත්තණියට සමාජයේ ඇතැම් අය නින්දා අපහාස කලත්,තමන්ගේ පවුල, දරුවෝ,සමාජය හා නිවස රකින්නට මේ ගමන යන්නට බොහෝ වෙහෙසෙනවා.රජුන් තන්නේ මව්න්.රජුන් පවා බිහි වෙන්නේ මව් කුසින්.ලෝකයට ආදරය ගෙන ආ අම්මාවරු, බිරින්දෑවරු,දියණිවරු,සොයුරියන්,මිතුරියන්, මිත්තණියන් ඒ වගකීම් ඉටු කරමින් යන මොහොතේ ඔවුන් සියලු දෙනාට මෙම කතාව උපහාරයක් වේවායි සුභාශිංසන එකතු කරමින්,සෑම කාන්තාවකටම ශක්තිමත් වෙලා දේශපාලන ගමන හෝ රටේ කුමන තනතුර හෝ වේවා,මේ සියල්ලේ උරෙන් උර ගැටී කටයුතු කිරීමට ශක්තිය ධෛර්යය ලැබේවා කියා ප්‍රාර්ථනා කරනවා.අද මේ සභාව නියෝජනය කරන්න මමත් සමඟ තවත් සහෝදර සහෝදරියන් අට දෙනෙක් ඉන්නවා.ඒක අපිට ලොකු ආඩම්බරයක්.ලොකු ශක්තියක්.ජාත්‍යන්තර කාන්තා දිනය සමරන මොහොතේ මේ කාන්තාවන්ට මේ ගමන යන්නට ශක්තියක් වෙන්න.සෑම සාර්ථක මිනිසෙක් පිටුපසම ඉන්නේ ගැහැණියක්. ජාත්‍යන්තර කාන්තා දිනයේ ඒ පිළිබඳව අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීම සම්බන්ධව මගේ ගෞරවනීය ස්තූතිය පල කරනවා.

<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී අයි. සද්නා දිල්හානි ප්‍රනාන්දු මහත්මිය - (ශ්‍රී.ල.පො.ජ.පෙ.)</u>

ඓතිහාසික නුවර දළදා පෙරහැරේ දන්ත ධාතූන් වහන්සේ වැඩම කල නැදුන්ගමුවේ ඇත් රජිඳා වෙනුවෙන් ශෝකය ප්‍රකාශ කිරීම හා ජාත්‍යන්තර කාන්තා දිනය වෙනුවෙන් අදහස් දැක්වීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මා ස්ථිර කරනවා.ඇත්තටම අපි කතා කරන්නේ කාටද හිතෙනවා.කාන්තා දිනය වෙනුවෙන්

තමයි අපේ යෝජනාව.අවසානෙට අපිට කියන්න තිබෙන දේ කියා ගන්න ඉන්න පිරිස මෙපමණයි. මවක්,බිරිඳක්,සොයුරියක්,මිතුරියක්,මිත්තණියක් විදියට අපි අපේ චරිතය ජීවිතය පුරා රඟ දක්වද්දී ඒ තුල අපිට බොහෝ දේ කතා කරන්න තිබෙනවා.මෙතන ඉන්න සියලු දෙනාටම බිරිඳක් ඉන්නවා.ඒ බිරිඳ දවසක දී බිළිඳියක් හැටියට,දියණියක් හැටියට,යුවතියක් හැටියට තවත් අම්මා කෙනෙකුගෙන් තමයි ඔබට ලැබුණේ.ඒක බොහොම සරල දෙයක් වුණාට ඒ දියණිය ඒ ගෙදරින් ඔබට දුන්න දවසේ ඒ අම්මා ලොකු වේදනාවක් එතුමිය දැරුවා.ඒ වගේම තාත්තා රහසින් අඬන්න ඇති.ඒ දේ නවත්වන්නත් ඒ ගෙදර අම්මාට වෙහෙසක් දරන්න සිදු වෙනවා.ඔබට හමුවන කාන්තාව ගැන මම මෙහෙම කියනවා.ඔබත් එක්ක එනවාත් එක්කම ඇගේ නම වෙනස් වුනා.ඇගේ නිවස වෙනස් වුනා.ඇගේ පවුලෙන් ඇය ඈත් වුනා.ඔබ වෙනුවෙන් ඇය පවුලක් තැනුවා.ඇය ගැබිණියක් වුනා.ප්‍රසූතියෙන් පසු ඇගේ ශරීරය වෙනස් වුනා.ඇගේ බර වැඩි උනා.ඇය මහා වේදනාවක් දරා බිහි කල දරුවාට ඔබේ නම තිබ්බා.ඇය මිය යන තුරුම සියල්ලන් වෙනුවෙන් ඉවුම් පිහුම්,නිවස පිරිසිදු කිරීම්,ඔබේ දෙමව්පියන් වෙනුවෙන් කැපකිරීම්,ඔබේ දරුවන් ඇති දැඩි කිරීම් සිදු කලා.ඔබට විවේකීව සිටිය හැකි ආකාරයට පවුල ගොඩනැගුවේ ඇයයි.ඔබට ප්‍රයෝජනවත් වන සෑම දෙයක්ම ඇගේ අලංකාරය,සෞඛ්‍යය,විනෝදාංශ කැප කරලා ඔබට ඇය ලබා දුන්නා.ආදරණීය මිනිසුනි,ඔබේ ජීවිතයේ ඔබට මුණ ගැහෙන කාන්තාවෝ සෑම විටම අගය කරන්න.ආරක්ෂා කරන්න.මන්ද කාන්තාවක් වීම පහසු නැත.කාන්තාවක් වීම මිල කල නොහැකි දෙයක්.කාන්තාවන් හැටියට සමාජය තුල අපි සියලු දෙනාම මහ තොටේ දී බස් රථයක දී පිරිමි අයගෙන් අපහසුතාවට පත් නොවුණ අවස්ථා නෑ.එහෙම වෙන්න එපා.සෑම විටම ඔබේ සිහිති දියණිය,යෙහෙළිය,සහෝදරිය,බිරිඳ ඇතුළු සෑම කාන්තාවක්ම ආරක්ෂා කරන්න.

<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනි එම්.නිශාන්ති ගුණතිලක මහත්මිය - (එ.ජා.ප.)</u>

ජාත්‍යන්තර කාන්තා දිනය දවසේ කාන්තාවන් පිළිබඳව අදහස් දැක්වීමට ඉදිරිපත් වීම සම්බන්ධව මගේ සහෝදර මන්ත්‍රීතුමියන් දෙපලට ස්තූතිවන්ත වෙනවා.අද මේ වන විට බටහිර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ජාත්‍යන්තර කාන්තා දිනය නිමිත්තෙන් උත්සවයක් පැවැත්වෙනවා.රටක් දැයකි ලොවකි ඇය යන තේමාව යටතේ විවිධ ස්ථානවල උත්සව පැවැත්වෙනවා.ප්‍රජා සංවර්ධන කටයුතු වල නිරත වීමට අපේ කාන්තාවන් සමත් වී තිබෙනවා.අතීතයේ කාන්තාවට තිබුණ තැන අපි දන්නවා.ස්ත්‍රියක් ඥානවන්ත නම් විචක්ෂණශීලී නම් ඇය රජකමටත් සුදුසුයි.අගමැතිතුමියක්,ජනාධිපතිතුමියක් අපේ රටෙන් බිහි වුනා.කාන්තාව ශක්තිමත් කියන එක අපිට ඔප්පු වී තිබෙනවා. ජාත්‍යන්තර කාන්තා දිනය දවසේ සියලුම කාන්තාවන්ට මෙවැනි කටයුතු වල නියැලී ඉදිරියට යාමට ධෛර්යය හා ශක්තිය ලැබේවා කියා ප්‍රාර්ථනා කරනවා.

<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>

ඓතිහාසික නුවර දළදා පෙරහැරේ දන්ත ධාතූන් වහන්සේ වැඩම කල නැදුන්ගමුවේ ඇත් රජිදා වෙනුවෙන් ශෝකය ප්‍රකාශ කිරීම හා ජාත්‍යන්තර කාන්තා දිනය වෙනුවෙන් අදහස් දැක්වීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව ඓතිහාසික නුවර දළදා පෙරහැරේ දන්ත ධාතූන් වහන්සේ වැඩම කල නැදුන්ගමුවේ ඇත් රජිදා වෙනුවෙන් ශෝකය ප්‍රකාශ කිරීම හා ජාත්‍යන්තර කාන්තා දිනය වෙනුවෙන් අදහස් දැක්වීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත විය.**

**06.කාරක සභාවල වාර්තා සහ එම වාර්තා එවෙලේම සලකා බැලීමට ප්‍රාදේශීය සභාව තීරණය කරන්නේ නම් මිස ඒවා සලකා බැලීම සඳහා දිනයක් නියම කිරීම.**

**I.2022.02.03 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීම, නිවාස සහ ප්‍රජා සංවර්ධනය,කාර්මික සේවා ,පරිසරය සහ පහසුකම් යන විෂයන් සම්බන්ධව උපදෙස් දීම සඳහා වන කාරක සභාවේ වාර්තාව මහා සභාවට ඉදිරිපත් කිරීම.**

<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>

2022.02.03 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීම, නිවාස සහ ප්‍රජා සංවර්ධනය,කාර්මික සේවා ,පරිසරය සහ පහසුකම් යන විෂයන් සම්බන්ධව උපදෙස් දීම සඳහා වන කාරක සභාවේ වාර්තාව සභා සම්මත කරන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩබ්ලිව්.ඒ.දනුක සුභාෂන් වනසිංහ මහතා - (ශ්‍රී.ල.පො.ජ.පෙ.)</u>

2022.02.03 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීම, නිවාස සහ ප්‍රජා සංවර්ධනය,කාර්මික සේවා ,පරිසරය සහ පහසුකම් යන විෂයන් සම්බන්ධව උපදෙස් දීම සඳහා වන කාරක සභාවේ වාර්තාව සංශෝධනයන්ට යටත්ව පිළිගැනීම සුදුසු බව මා යෝජනා කරනවා.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.එම්.නන්දසිරි මහතා - (එ.ජ.නි.ස.)**

2022.02.03 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීම, නිවාස සහ ප්‍රජා සංවර්ධනය,කාර්මික සේවා ,පරිසරය සහ පහසුකම් යන විෂයන් සම්බන්ධව උපදෙස් දීම සඳහා වන කාරක සභාවේ වාර්තාව සංශෝධනයන්ට යටත්ව පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා**

2022.02.03 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීම, නිවාස සහ ප්‍රජා සංවර්ධනය,කාර්මික සේවා ,පරිසරය සහ පහසුකම් යන විෂයන් සම්බන්ධව උපදෙස් දීම සඳහා වන කාරක සභාවේ වාර්තාව සංශෝධනයන්ට යටත්ව පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සහා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව 2022.02.03 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීම, නිවාස සහ ප්‍රජා සංවර්ධනය,කාර්මික සේවා ,පරිසරය සහ පහසුකම් යන විෂයන් සම්බන්ධව උපදෙස් දීම සඳහා වන කාරක සභාවේ වාර්තාව සංශෝධනයන්ට යටත්ව පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සහා සම්මත විය.**

## II.2022.02.11 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීම, නිවාස සහ ප්‍රජා සංවර්ධනය,කාර්මික සේවා ,පරිසරය සහ පහසුකම් යන විෂයන් සම්බන්ධව උපදෙස් දීම සඳහා වන කාරක සභාවේ වාර්තාව මහා සභාවට ඉදිරිපත් කිරීම.

**ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා**

2022.02.11 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීම, නිවාස සහ ප්‍රජා සංවර්ධනය,කාර්මික සේවා ,පරිසරය සහ පහසුකම් යන විෂයන් සම්බන්ධව උපදෙස් දීම සඳහා වන කාරක සභාවේ වාර්තාව සහා සම්මත කරන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩබ්ලිව්.ඒ.දනුක සුභාෂන් වනසිංහ මහතා - (ශ්‍රී.ල.පො.ජ.පෙ.)**

2022.02.11 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීම, නිවාස සහ ප්‍රජා සංවර්ධනය,කාර්මික සේවා ,පරිසරය සහ පහසුකම් යන විෂයන් සම්බන්ධව උපදෙස් දීම සඳහා වන කාරක සභාවේ වාර්තාව සංශෝධනයන්ට යටත්ව පිළිගැනීම සුදුසු බව මා යෝජනා කරනවා.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.එම්.නන්දසිරි මහතා - (එ.ජ.නි.ස.)**

2022.02.11 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීම, නිවාස සහ ප්‍රජා සංවර්ධනය,කාර්මික සේවා ,පරිසරය සහ පහසුකම් යන විෂයන් සම්බන්ධව උපදෙස් දීම සඳහා වන කාරක සභාවේ වාර්තාව සංශෝධනයන්ට යටත්ව පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා**

2022.02.11 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීම, නිවාස සහ ප්‍රජා සංවර්ධනය,කාර්මික සේවා ,පරිසරය සහ පහසුකම් යන විෂයන් සම්බන්ධව උපදෙස් දීම සඳහා වන කාරක සභාවේ වාර්තාව සංශෝධනයන්ට යටත්ව පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සහා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව 2022.02.11 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීම, නිවාස සහ ප්‍රජා සංවර්ධනය,කාර්මික සේවා ,පරිසරය සහ පහසුකම් යන විෂයන් සම්බන්ධව උපදෙස් දීම සඳහා වන කාරක සභාවේ වාර්තාව සංශෝධනයන්ට යටත්ව පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සහා සම්මත විය.**

## III.2022.02.24 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීම, නිවාස සහ ප්‍රජා සංවර්ධනය,කාර්මික සේවා ,පරිසරය සහ පහසුකම් යන විෂයන් සම්බන්ධව උපදෙස් දීම සඳහා වන කාරක සභාවේ වාර්තාව මහා සභාවට ඉදිරිපත් කිරීම.

**ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා**

2022.02.24 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීම, නිවාස සහ ප්‍රජා සංවර්ධනය,කාර්මික සේවා ,පරිසරය සහ පහසුකම් යන විෂයන් සම්බන්ධව උපදෙස් දීම සඳහා වන කාරක සභාවේ වාර්තාව සහා සම්මත කරන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩබ්ලිව්.ඒ.දනුක සුභාෂන් වනසිංහ මහතා - (ශ්‍රී.ල.පො.ජ.පෙ.)**

2022.02.24 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීම, නිවාස සහ ප්‍රජා සංවර්ධනය,කාර්මික සේවා ,පරිසරය සහ පහසුකම් යන විෂයන් සම්බන්ධව උපදෙස් දීම සඳහා වන කාරක සභාවේ වාර්තාව සංශෝධනයන්ට යටත්ව පිළිගැනීම සුදුසු බව මා යෝජනා කරනවා.

<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.එම්.නන්දසිරි මහතා - (එ.ජ.නි.ස.)</u>

2022.02.24 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීම, නිවාස සහ ප්‍රජා සංවර්ධනය,කාර්මික සේවා ,පරිසරය සහ පහසුකම් යන විෂයන් සම්බන්ධව උපදෙස් දීම සඳහා වන කාරක සභාවේ වාර්තාව සංශෝධනයන්ට යටත්ව පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මා ස්ථිර කරනවා.

<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>

2022.02.24 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීම, නිවාස සහ ප්‍රජා සංවර්ධනය,කාර්මික සේවා ,පරිසරය සහ පහසුකම් යන විෂයන් සම්බන්ධව උපදෙස් දීම සඳහා වන කාරක සභාවේ වාර්තාව සංශෝධනයන්ට යටත්ව පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව 2022.02.24 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීම, නිවාස සහ ප්‍රජා සංවර්ධනය,කාර්මික සේවා ,පරිසරය සහ පහසුකම් යන විෂයන් සම්බන්ධව උපදෙස් දීම සඳහා වන කාරක සභාවේ වාර්තාව සංශෝධනයන්ට යටත්ව පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත විය.**

**07.ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ,එකතු කල ආදායම පිළිබඳ ප්‍රගති වාර්තා සහ ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කිරීමට නියමිත වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම හා සලකා බැලීම.**

**I. 2022 පෙබරවාරි මස ප්‍රා.ස.14 (මාසික ඒකාබද්ධ වැය සාරාංශය)**

**උපලේඛන 01 සඳහා අනිත් පිට බලන්න.**

## උපලේඛන 01

| අය විෂය අංකය | වැය විෂය නාමයන් | 1 පොදු පරිපාලනය | 2 සෞඛ්‍ය සේවා | 3 භෞතික සැලසුම් මංමාවත් ඉඩම් | 4 ජල සේවා | 5 වෙනත් උපයෝගී සේවා | 6 සුභසාධක සේවා | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| 1 | වැටුප් හා දීමනා | 2430016.59 | 1523667.87 | 1410040.45 | 42440.00 | 137504.93 | 2434228.08 | 7977897.92 |
| 2 | ගමන් වියදම් | 100440.00 | 0.00 | 2100.00 | 0.00 | 0.00 | 0.00 | 102540.00 |
| 3 | සැපයුම් හා උපකරණ | 172378.00 | 402517.00 | 214359.00 | 885.00 | 40000.00 | 34250.00 | 864389.00 |
| 4 | ප්‍රාග්ධන වත්කම් අලුත්වැඩියා හා නඩත්තු | 80097.50 | 63235.00 | 93414.00 | 0.00 | 2800.00 | 0.00 | 239546.50 |
| 5 | ප්‍රවාහන, සම්බන්ධතා ආවශ්‍යක හා වෙනත් සේවා | 13448.40 | 21356.10 | 0.00 | 545663.52 | 30200.70 | 2604.90 | 613273.62 |
| 6 | පොළී ගෙවීම්, ලාභාංශ හා ප්‍රසාද මුදල් | 0.00 | 0.00 | 2778.21 | 0.00 | 89.12 | 0.00 | 2867.33 |
| 7 | ආධාර මුදල් ,දායක මුදල් හා සහනාධාර | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 18560.00 | 18560.00 |
| 8 | විශ්‍රාම වැටුප් විශ්‍රාම ප්‍රතිලාභ හා පාරිතෝෂික | 0.00 | 44548.84 | 0.00 | 0.00 | 0.00 | 12687.01 | 57235.85 |
| | **පුනරාවර්ථන වැය එකතුව** | **2796380.49** | **2055324.81** | **1722691.66** | **588988.52** | **210594.75** | **2502329.99** | **9876310.22** |
| | ප්‍රාග්ධන වියදම් | | | | | | | |
| 9 | ප්‍රාග්ධන වැය | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| 10 | ණය ආපසු ගෙවීම් | 0.00 | 0.00 | 10658.54 | 0.00 | 354.69 | 0.00 | 11013.23 |
| | **ප්‍රාග්ධන වැය එකතුව** | **0.00** | **0.00** | **10658.54** | **0.00** | **354.69** | **0.00** | **11013.23** |
| | **පුනරාවර්ථන වැය හා ප්‍රාග්ධක වැය එකතුව** | **2796380.49** | **2055324.81** | **1733350.20** | **588988.52** | **210949.44** | **2502329.99** | **9887323.45** |
| | තැන්පත් | 2502035.00 | | | | | | 2502035.00 |
| | වැට් | 0.00 | | | | | | 0.00 |
| | ජාතිය ගොඩනැගීමෙ බද්ද | 0.00 | | | | | | 0.00 |
| | මුද්දර බද්ද | 0.00 | | | | | | 0.00 |
| | සේවක ණය | 1250000.00 | | | | | | 1250000.00 |
| | අත්තිකාරම් | 43384.60 | | | | | | 43384.60 |
| | ණයහිමි | 8520159.92 | | | | | | 8520159.92 |
| | සමුච්චිත අරමුදල | 0.00 | | | | | | 0.00 |
| | ආයෝජන | 0.00 | | | | | | 0.00 |
| | අගරු චෙක් | 0.00 | | | | | | 0.00 |
| | මුදල් මාරු | 0.00 | | | | | | 0.00 |
| | වෙනත් | 0.00 | | | | | | 0.00 |
| | **මුළු එකතුව** | **12315579.52** | | | | | | **22202902.97** |

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

2022 පෙබරවාරි මස ප්‍රා.ස.14 (මාසික ඒකාබද්ධ වැය සාරාංශය) සභා සම්මත කරන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩබ්ලිව්.ඒ.දනුක සුභාෂන් වනසිංහ මහතා - (ශ්‍රී.ල.පො.ජ.පෙ.)</u>**

2022 පෙබරවාරි මස ප්‍රා.ස.14 (මාසික ඒකාබද්ධ වැය සාරාංශය) පිළිගැනීම සුදුසු බව මා යෝජනා කරනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.එම්.නන්දසිරි මහතා - (එ.ජ.නි.ස.)</u>**

2022 පෙබරවාරි මස ප්‍රා.ස.14 (මාසික ඒකාබද්ධ වැය සාරාංශය) පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මා ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

2022 පෙබරවාරි මස ප්‍රා.ස.14 (මාසික ඒකාබද්ධ වැය සාරාංශය) ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව 2022** පෙබරවාරි **මස ප්‍රා.ස.14 (මාසික ඒකාබද්ධ වැය සාරාංශය) ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත විය.**

## II. 2022 පෙබරවාරි මස ප්‍රා.ස.16 (මාසික ඒකාබද්ධ ලැබීම් සාරාංශය)

**උපලේඛන 02 සඳහා අනිත් පිට බලන්න.**

## උපලේඛන 02

| අය විෂය නාමයන් | පොදු පරිපාලනය | සෞඛ්‍ය සේවා | භෞතික සැළසුම් මංමාවත්/ඉඩම් හා ගොඩනැගිලි | ජල සේවා | වෙනත් උපයෝගී සේවා | සුභ සාධක සේවා | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 |
| 10 වරිපනම් හා බදු | 56334.60 | 313700.00 | - | - | - | 81750.00 | 451784.60 |
| 20 කුලී | - | - | 740406.91 | - | 1832533.00 | 10000.00 | 2582939.91 |
| 30 බලපත්‍ර ගාස්තු | 75.00 | 127750.00 | - | - | - | 2400.00 | 130225.00 |
| 40 සේවා සඳහා ගාස්තු | 0.00 | 408384.00 | 201044.00 | 35994.68 | - | 10595.00 | 656017.68 |
| 50 වරෙන්තු ගාස්තු හා දඩ | 0.00 | 0.00 | 8462.00 | 0.00 | 566.10 | 0.00 | 9028.10 |
| 60 වෙනත් ආදායම් | 30956.19 | 81875.00 | 0.00 | 312575.15 | 24390.00 | 90.00 | 449886.34 |
| 70වෙනත් ආධාර | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| **පුනරාවර්තන ආදායම් එකතුව** | **87365.79** | **931709.00** | **949912.91** | **348569.83** | **1857489.10** | **104835.00** | **4279881.63** |
| ප්‍රාග්ධන ආධාර | | | | | | | |
| 80 මූලධන ලැබීම් | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| **පුනරාවර්තන ආදායම් හා ප්‍රාග්ධන ආදායම්වල එකතුව** | **87365.79** | **931709.00** | **949912.91** | **348569.83** | **1857489.10** | **104835.00** | **4279881.63** |
| තැන්පත් | 470129.04 | | | | | | 470129.04 |
| වැට් | 0.00 | | | | | | 0.00 |
| ජා.ගො.බද්ද | 0.00 | | | | | | 0.00 |
| මුද්දර බදු | 25647.17 | | | | | | 25647.17 |
| සේවක ණය | 356365.50 | | | | | | 356365.50 |
| අත්තිකාරම් | 0.00 | | | | | | 0.00 |
| ණය ගැති | 1098327.01 | | | | | | 1098327.01 |
| සමු: අරමුදල | 15030.00 | | | | | | 15030.00 |
| ආයෝජන | 0.00 | | | | | | 0.00 |
| අගරු චෙක් | 0.00 | | | | | | 0.00 |
| මුදල් මාරු | 0.00 | | | | | | 0.00 |
| ශීර්ෂ බැර | 8126.08 | | | | | | 8126.08 |
| **මුළු එකතුව** | **1973624.80** | | | | | | **6253506.43** |

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

2022 පෙබරවාරි මස ප්‍රා.ස.16 (මාසික ඒකාබද්ධ ලැබීම් සාරාංශය) සභා සම්මත කරන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩබ්ලිව්.ඒ.දනුක සුභාෂන් වනසිංහ මහතා - (ශ්‍රී.ල.පො.ජ.පෙ.)</u>**

2022 පෙබරවාරි මස ප්‍රා.ස.16 (මාසික ඒකාබද්ධ ලැබීම් සාරාංශය) පිළිගැනීම සුදුසු බව මා යෝජනා කරනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.එම්.නන්දසිරි මහතා - (එ.ජ.නි.ස.)</u>**

2022 පෙබරවාරි මස ප්‍රා.ස.16 (මාසික ඒකාබද්ධ ලැබීම් සාරාංශය) පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මා ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

2022 පෙබරවාරි මස ප්‍රා.ස.16 (මාසික ඒකාබද්ධ ලැබීම් සාරාංශය) ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව 2022 පෙබරවාරි මස ප්‍රා.ස.16 (මාසික ඒකාබද්ධ ලැබීම් සාරාංශය) ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත විය.**

## III. 2022 පෙබරවාරි මස ප්‍රා.ස.07 (හිඟ ආදායම් වාර්තාව)

**උපලේඛන 03 සඳහා අනිත් පිට බලන්න.**

## උපලේඛන 03

| අනු අංකය | අය විෂය | මාසය මුලදී හිඟය<br>1 | මාසය මුලදී ඉදිරියට ලැබීම්<br>2 | මාසය තුළ බිල් කිරීම්<br>3 | ලැබිය යුතු මුළු ආදායම<br>4<br>(1+3) | මාසය තුළ ලද ආදායම<br>5 | මාසයට අදාල කලින් ලැබූ ආදායම<br>6 | ඉදිරියට ගෙන යන කලින් ලැබූ ආදායම<br>7<br>( 2-6) | මාසය තුළ ලද ආදායමින් ඉදිරියට ලැබූ ආදායම<br>8 | මාසය තුළ ලද ආදායමින් අය වූ හිඟය<br>9 | ඉදිරියට ගෙන යන හිඟය<br>10<br>4 - (5+6) | ඉදිරියට ලැබීම්<br>11<br>(7+8) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | වරිපනම් බදු 1/11 | 44379.67 | 100440.29 | 0.00 | 0.00 | 56223.85 | 0.00 | 0.00 | 0.00 | 599.25 | 0.00 | 0.00 |
| 2 | අක්කර බදු 1/12 | 17515.50 | 4612.66 | 0.00 | 0.00 | 410.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| 3 | කඩ කුලී 3/22 | 321969.97 | 46533.63 | 722350.00 | 1044319.97 | 724306.91 | 36433.63 | 10100.00 | 50117.34 | 6570.00 | 333696.77 | 54967.34 |
| 4 | වත්කම් බදු 5/23 | 2041648.73 | 18610.00 | 1164506.00 | 3206154.73 | 1468851.91 | 14210.00 | 4400.00 | 39507.00 | 273808.91 | 1762599.82 | 43907.00 |
| 5 | ජල ගාස්තු 4/62 | 984353.70 | 64701.93 | 467704.00 | 1452057.70 | 295580.15 | 16709.00 | 47992.93 | 12021.28 | 104218.85 | 1047570.99 | 59909.21 |
| 6 | ව්‍යාපාර බදු 2/16 | 0.00 | 0.00 | 307200.00 | 307200.00 | 307200.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| 7 | කර්මාන්ත බදු 2/14 | 0.00 | 0.00 | 6500.00 | 6500.00 | 6500.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| 8 | වෙළඳ බලපත්‍ර 2/31 | 0.00 | 0.00 | 127750.00 | 127750.00 | 127750.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| 9 | විශේෂ බලපත්‍ර ගාස්තු2/34 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| 10 | එකතුව | 3409867.57 | 234898.51 | 2796010.00 | 6143982.40 | 2986822.82 | 67352.63 | 62492.93 | 101645.62 | 385197.01 | 3143867.58 | 158783.55 |

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

2022 පෙබරවාරි මස ප්‍රා.ස.07 (හිඟ ආදායම් වාර්තාව) සභා සම්මත කරන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩබ්ලිව්.ඒ.දනුක සුභාෂන් වනසිංහ මහතා - (ශ්‍රී.ල.පො.ජ.පෙ.)</u>**

2022 පෙබරවාරි මස ප්‍රා.ස.07 (හිඟ ආදායම් වාර්තාව) පිළිගැනීම සුදුසු බව මා යෝජනා කරනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.එම්.නන්දසිරි මහතා - (එ.ජ.නි.ස.)</u>**

2022 පෙබරවාරි මස ප්‍රා.ස.07 (හිඟ ආදායම් වාර්තාව) පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මා ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

2022 පෙබරවාරි මස ප්‍රා.ස.07 (හිඟ ආදායම් වාර්තාව) ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව 2022 පෙබරවාරි මස ප්‍රා.ස.07 (හිඟ ආදායම් වාර්තාව) ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත විය.**

## IV. 2022 අප්‍රේල් මාසික ආදායම් පුරෝකථන වාර්තාව

**උපලේඛන 04 සඳහා අනිත් පිට බලන්න.**

# උපලේඛන 04

| ආදායම් ශීර්ෂය | වාර්ෂික ආදායම් ඇස්තමේන්තුව | | | මාසික ආදායම් පුරෝකථන | | | අය වී ඇති ආදායම 2022 පෙබරවාරි. | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | අය - වැය ලේඛනය අනුව (1) | පරිපූරක මඟින් (2) | එකතුව3(1+2) | පෙර මාසය දක්වා (4) | මාසය තුළ(5) | එකතුව6(4+5) | පෙර මාසය දක්වා (7) | මාසය තුළ (8) | එකතුව 9(7+8) |
| වරිපනම් ( 1/11) | 1785000 | 0 | 1785000 | 448000 | 150000 | 598000 | 927865.13 | 55623.85 | 983488.98 |
| අක්කර බදු ( 1/12 ) | 50000 | 0 | 50000 | 16000 | 3000 | 19000 | 832 | 410 | 1242 |
| කසල බදු(2/13) | 1000 | 0 | 1000 | 250 | 50 | 300 | 0 | 0 | 0 |
| කර්මාන්ත බදු(2/16/i) | 50000 | 0 | 50000 | 50000 | 0 | 50000 | 6000 | 6500 | 12500 |
| ඇතැම් ව්‍යාපාර බදු(2/16/iii) | 1000 | 0 | 1000 | 1000 | 0 | 1000 | 0 | 0 | 0 |
| ව්‍යාපාර බදු ( 2/16/ii ) | 2000000 | 0 | 2000000 | 2000000 | 0 | 2000000 | 514200 | 307200 | 821400 |
| බලපත්‍ර ගාස්තු ( 2/31/i ) | 1400000 | 0 | 1400000 | 1360000 | 4000 | 1364000 | 289133.15 | 127750 | 416883.15 |
| විශේෂ බල:ගාස්තු(2/31/ii) | 125000 | 0 | 125000 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| කඩ කුලී ( 3/22 ) | 8350800 | 0 | 8350800 | 2087700 | 695900 | 2783600 | 699216.13 | 724306.91 | 1423523.04 |
| ජංගම අලෙවි කුටි( 3/22-i) | 297000 | 0 | 297000 | 297000 | 0 | 297000 | 262200 | 0 | 262200 |
| රථගාල් ගාස්තු(3/43/3) | 300000 | 0 | 300000 | 85000 | 30000 | 115000 | 7200 | 18000 | 25200 |
| ජල ගාස්තු(4/62,64) | 5800000 | 0 | 5800000 | 1449000 | 483000 | 1932000 | 231208.65 | 399799 | 631007.65 |
| සතිපොල බදු ( 5/22 ) | 8470000 | 0 | 8470000 | 2394000 | 850000 | 3244000 | 707460 | 637490 | 1344950 |
| බදු කුලී ( 5/23 ) | 8214535 | 0 | 8214535 | 1642910 | 821455 | 2464365 | 3579581.6 | 3579581.6 | 7159163.2 |
| විනෝද බදු ( 6/15 ) | 400000 | 0 | 400000 | 82500 | 37500 | 120000 | 37875 | 81750 | 119625 |
| ප්‍රජා ශාලා/ක්‍රීඩා පි(6/25/2) | 160000 | 0 | 160000 | 34500 | 11000 | 45500 | 0 | 0 | 0 |
| එකතුව | 38889943 | 0 | 38889943 | 11947860 | **3085905** | 15033765 | 7262771.66 | 5938411.36 | 13201183.02 |

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

2022 අප්‍රේල් මාසික ආදායම් පුරෝකථන වාර්තාව සභා සම්මත කරන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩබ්ලිව්.ඒ.දනුක සුභාෂන් වනසිංහ මහතා - (ශ්‍රී.ල.පො.ජ.පෙ.)</u>**

2022 අප්‍රේල් මාසික ආදායම් පුරෝකථන වාර්තාව පිළිගැනීම සුදුසු බව මා යෝජනා කරනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.එම්.නන්දසිරි මහතා - (එ.ජ.නි.ස.)</u>**

2022 අප්‍රේල් මාසික ආදායම් පුරෝකථන වාර්තාව පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මා ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

2022 අප්‍රේල් මාසික ආදායම් පුරෝකථන වාර්තාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව 2022 අප්‍රේල් මාසික ආදායම් පුරෝකථන වාර්තාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත විය.**

## V. 2022 මාර්තු මස මාසික වියදම් පුරෝකථන වාර්තාව

**උපලේඛන 05 සඳහා අනිත් පිට බලන්න.**

# උපලේඛන 05

| අනු අංකය | වැය ශීර්ෂය | වාර්ෂික වියදම් ඇස්තමේන්තුව | | | වියදම් පුරෝකථනය | | | වැය කල මුදල | | | අතිරික්තය/ ඌනතාවය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | අයවැය ලේඛනය | වැය ශීර්ෂ මාරු කිරීම / පරිපූරක | එකතුව | මාසය මුලදී | මාසය තුලදී | එකතුව | මාසය මුලදී | මාසය තුලදී | එකතුව | |
| 1 | වැටුප් දීමනා | 93270132.00 | | 93270132.00 | 15545022.00 | 7772511.00 | 23317533.00 | 13897229.22 | 8000000.00 | 21897229.22 | 1420303.78 |
| 2 | ගමන් වියදම් | 1064000.00 | | 1064000.00 | 150000.00 | 80000.00 | 230000.00 | 50000.00 | 102540.00 | 152540.00 | 77460.00 |
| 3 | සැපයුම් හා උපකරණ | 12263000.00 | | 12263000.00 | 1238000.00 | 925000.00 | 2163000.00 | 646380.82 | 864389.00 | 1510769.82 | 652230.18 |
| 4 | ප්‍රග්ධන වත්කම් අළුත් වැඩියාව හා නඩත්තුව | 14040000.00 | | 14040000.00 | 3600000.00 | 2000000.00 | 5600000.00 | 1770300.00 | 239546.00 | 2009846.00 | 3590154.00 |
| 5 | ප්‍රවාහන සම්බන්ධතා , අවශ්‍යතා හා වෙනත් සේවා | 11474000.00 | | 11474000.00 | 2000000.00 | 1000000.00 | 3000000.00 | 95000.00 | 613273.00 | 708273.00 | 2291727.00 |
| 6 | පොලී ගෙවීම් , ලාභාංශ සහ ප්‍රසාද මුදල් | 167360.00 | | 167360.00 | 10784.73 | 9000.00 | 19784.73 | 10500.00 | 2868.00 | 13368.00 | 6416.73 |
| 7 | ආධාර මුදල් ,දායක මුදල් හා සහනාධාර | 6138000.00 | | 6138000.00 | 480000.00 | 450000.00 | 930000.00 | 425000.00 | 30000.00 | 455000.00 | 475000.00 |
| 8 | විශ්‍රාම වැටුප් ,විශ්‍රාම ප්‍රතිලාභ හා පාරිතෝෂිත | 968040.00 | | 968040.00 | 188000.00 | 60000.00 | 248000.00 | 135000.00 | 57236.00 | 192236.00 | 55764.00 |
| 9 | උපකරණ වැය | 34425000.00 | | 34425000.00 | 6000000.00 | 3500000.00 | 9500000.00 | 2150000.00 | 100000.00 | 2250000.00 | 7250000.00 |
| 10 | ණය ආපසු ගෙවීම් | 2196000.00 | | 2196000.00 | 49595.83 | 25000.00 | 74595.83 | 40000.00 | 11013.00 | 51013.00 | 23582.83 |
| | එකතුව | 176005532.00 | | 176005532.00 | 29261402.56 | 15821511.00 | 45082913.56 | 19219410.04 | 10020865.00 | 29240275.04 | 15842638.52 |

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

2022 මාර්තු මස මාසික වියදම් පුරෝකථන වාර්තාව සභා සම්මත කරන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩබ්ලිව්.ඒ.දනුක සුභාෂන් වනසිංහ මහතා - (ශ්‍රී.ල.පො.ජ.පෙ.)</u>**

2022 මාර්තු මස මාසික වියදම් පුරෝකථන වාර්තාව පිළිගැනීම සුදුසු බව මා යෝජනා කරනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.එම්.නන්දසිරි මහතා - (එ.ජ.නි.ස.)</u>**

2022 මාර්තු මස මාසික වියදම් පුරෝකථන වාර්තාව පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මා ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

2022 මාර්තු මස මාසික වියදම් පුරෝකථන වාර්තාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත වූ බව දන්වා සිටිනවා.
**ඒ අනුව 2022 මාර්තු මස මාසික වියදම් පුරෝකථන වාර්තාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත විය.**

08.රැස්වීම කැඳවීමේ දැන්වීමේ වෙනත් කාරණා කිසිවක් දක්වා ඇත්නම්, ඒ කරුණු එහි දක්වා ඇති අනුපිළිවෙලට හෝ විශේෂ හේතු නිසා ප්‍රාදේශීය සභාව විසින් තීරණය කරන අනුපිළිවෙලට - නැත.

න්‍යාය පත්‍රානුකූලව ගරු සභාවේ කටයුතු අවසන් වූ බවත් ,2022 වර්ෂයේ මාර්තු මස මහ සභාවේ කටයුතු සාර්ථක කර ගැනීම සඳහා දායක වූ සැමට ස්තූතිය පිරිනමන බවත්, ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.ප.ව.12.50 ට පමණ ගරු සභාවේ කටයුතු අවසන් කරන ලදී.

සටහන් කලේ :පී.ඒ.ඩී.එස්.දිසානායක,කළමනාකරණ සේවා නිලධාරී.

වාර්තා කලේ :එච්.ඒ.ජී.නිශ්ශංක,ලේකම්,පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව